## 2025-06-20 වන දින පැවති ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ.

## සාමාන්‍ය මහා සභා රැස්වීම් වාර්තාව.

මෙදින පෙ.ව 9.30ට සාමාන්‍ය මහා සභා රැස්වීම ආරම්භ වූ අතර පහත නම් සඳහන් ගරු සභික මහත්ම මහත්මීන් සහභාගී විය.

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01. | ගරු සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමා | ගරු සභාපති |
| 02. | ගරු මන්ත්‍රී යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා | ගරු උප සභාපති |
| 03. | ගරු මන්ත්‍රී ජී.එච්.එස්.එන්.කේ.විජේසූරිය මැතිතුමා | සභික |
| 04. | ගරු මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා | සභික |
| 05. | ගරු මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා | සභික |
| 06. | ගරු මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමා | සභික |
| 07. | ගරු මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා | සභික |
| 08. | ගරු මන්ත්‍රිනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය | සභික |
| 09. | ගරු මන්ත්‍රිනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය | සභික |
| 10. | ගරු මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා | සභික |
| 11 | ගරු මන්ත්‍රී කේ.ජ්.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා | සභික |
| 12 | ගරු මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා | සභික |
| 13 | ගරු මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා | සභික |
| 14 | ගරු මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා | සභික |
| 15 | ගරු මන්ත්‍රී එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය | සභික |
| 16 | ගරු මන්ත්‍රී කේ.ඩබ්.ජ්.නදුන් සමීර මැතිතුමා | සභික |
| 17 | ගරු මන්ත්‍රිනී එස්.ජ්.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය | සභික |
| 18 | ගරු මන්ත්‍රී එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා | සභික |
| 19 | ගරු මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා | සභික |
| 20 | ගරු මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා | සභික |
| 21 | ගරු මන්ත්‍රී ජ්.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා | සභික |
| 22 | ගරු මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා | සභික |
| 23 | ගරු මන්ත්‍රී ජ්.එස්.එම්.මිස්බාහ් මැතිතුමා | සභික |
| 24 | ගරු මන්ත්‍රී ජ්.ටී.සී.අතුරලිය මැතිතුමා | සභික |
| 25 | ගරු මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා | සභික |
| 26 | ගරු මන්ත්‍රිනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය | සභික |
| 27 | ගරු මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා | සභික |
| 28 | ගරු මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා | සභික |
| 29 | ගරු මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා | සභික |
| 30 | ගරු මන්ත්‍රිනී පී.ජ්.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය | සභික |

**නොපැමිණි:-**

- එච්.එම්.පී.මාලින්ද මුදන්නායක මැතිතුමා.

01..ටී.ආර්.සී.කේ.ගුණසේකර මයා සභාවේ ලේකම් ලෙස සහභාගී විය.

**සභාපතිතුමා:-**

අපි එහෙනම් අද මංගල සභාව ආරම්භ කරමු.මේ අවස්ථාවේදී මම ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ තේරී පත්වුණු මේ ස්ථානයට පැමිණ සිටින සියලුම මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන් ඉතාමත්මත් ම ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා. ඒ වගේම මේ ස්ථානයේ සිටින ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමා, ඒවගේ ම ඒ නිලධාරී මහත්මීන් දෙපල ඒ වගේ ම මාධ්‍යවේදීන් හිතවතුන් සහ මේ ස්ථානයට පැමිණ සිටින මහජන

නියෝජිතයින් සියලු දෙනාම ඉතාමත්ම ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.සියලු දෙනාටම සුභ උදෑසනක් වේවා කියලා ප්‍රාර්ථනාකරමින් අපි වැඩේ පටන් ගමු.

**සභාපතිතුමා:-**

ප්‍රථමයෙන්ම තියෙන්නේ අපේ 2023-03-14 දින සාමාන්‍ය සභා වාර්තාව සභා සම්මත කිරීම.

**01.පසුගිය සභා වාර්තා සභා සම්මත කිරීම.**

**i.2023 -03 -14 දින සාමාන්‍ය සභා වාර්තාව සභා සම්මත කිරීම.**

**සභික ජී.එච්.සුජීව විජේසූරිය මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,මං හිතන්නේ අපිට කරුණු නම් ගොඩක් සම්බන්ධව මතකයක් නෑ මේ වාර්තව සම්බන්ධව,ඒ වුණාට ඒ සභාවේ හිටිය සභිකයෙක් විදියට ඔබතුමා ගෙනා ඒ යෝජනාව, මං හිතන්නේ සංශෝධන සහිතව අවශ්‍ය ද ,

**සභාපතිතුමා:-**

අවශ්‍ය නෑ.

**සභික ජී.එච්.සුජීව විජේසූරිය මැතිතුමා:-**

ඔබතුමාගේ ඒ යෝජනාව ස්ථිර කරනවා.

ඒ අනුව 2023 -03 -14 දින සාමාන්‍ය සභා වාර්තාව ඒකමතිතව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**

මී ළඟට තිබෙන්නේ මී ළඟට තිබෙන්නේ න්‍යායපත්‍රානුකූල තියෙන්නේ 2025-06-09 දින අපි පවත්වන ලද විශේෂ සභා වාර්තාව සභා සම්මත කිරීම.

**ii.2025 -06 -09 දින විශේෂ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

**උපසභාපතිතුමා:-**

ගරු සභාපතිතුමනි 2025-06-09 වන දින පවත්වන ලද විශේෂ සභා වාර්තාව මම ස්ථිර කරනවා.

ඒ අනුව 2025 -06 -09 දින විශේෂ සභා වාර්තාව ඒකමතිතව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**

බොහොමත් ම ස්තූතියි.

**සභාපතිතුමා:-**

න්‍යායපත්‍රානුකූලව මීලඟට තියෙන්නේ, සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන විශේෂ නිවේදන.

**02.සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන විශේෂ නිවේදන.**

**සභාපතිතුමා:-**

විශේෂ නිවේදන නම් ඉදිරිපත් කිරීමට මේ අවස්ථාවේ ලැබී නෑ.

**සභාපතිතුමා:-**

මීලඟට තියෙනවා මහා සභාවට පැමිණිය නොහැකි බව දන්වා එවා ඇති ලිපි සභා ගත කිරීම තියෙන්නේ

**03.මහා සභාවට පැමිණිය නොහැකි බව දන්වා එවා ඇති ලිපි සභා ගත කිරීම.**

මේ අවස්ථාවේ එක මන්ත්‍රී කෙනෙක් එච්.එම්.පී.මාලින්ද මුදන්නායක මන්ත්‍රීවරයා නිවාඩු අනුමත කර ගැනීම සඳහා එවල තියෙනවා ලිපියක් එවල තියෙනවා.

ඉහත නම් සඳහන් මා අසනීප වී සිටින බැවින් 2025-06-20 වන දින පැවැත්වෙන මහා සභා රැස්වීමට සහභාගී විමට නොහැකි බව ඉතා කාරුණිකව දන්වා සිටිමි.එබැවින් නිවාඩු අනුමත කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා සිටිමි.මෙයට ,ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එම් පි. මාලින්ද මුදන්නායක.

**උපසභාපතිතුමා:-**
ගරු සභාපතිතුමනි සභාවට පැමිණිය නොහැකි බව දන්වා ඇති නිවාඩු අනුමත කිරීම යෝජනා කරනවා

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**04.ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ , පෙත්සම් , පැමිණිලි හා සන්නිවේදන.**

**සභාපතිතුමා:-**

යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න තමයි මීළඟට තියෙන්නේ.

**05.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -**

**සභාපතිතුමා:-**

අපට මේ සභාවට කල් දී ඇති ප්‍රශ්න යොමු වෙලා නෑ.

**සභාපතිතුමා:-**

ඊට පස්සෙ අපට තියෙනවා යථා පරිදි කල් දී ඇති යෝජනා තමයි අපි ඉදිරිපත් කිරීමට සූදානම් වන්නේ පළවෙනි යෝජනාව

**06.යථා පරිදි කල් දී ඇති යෝජනා -**

**සභාපතිතුමා:-**

**I. ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ විථි පහන් අලුත්වැඩියා කළ යුතු බැවින් සාමාන්‍ය විදුලි රැහැන්වලට සම්බන්ධ කරන විථි පහන් මෙන් ස්වංක්‍රියව ක්‍රියාත්මක වන LED පහන් අතුරු මාර්ගවල මංසන්ධි සඳහා සූර්යකෝෂ මඟින් සාමාන්‍ය විදුලි රැහැන්වලට සම්බන්ධ කරන විථි පහන් මෙන්ම නියමිත ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් වීථි පහන් හා ඊට අදාළ ද්‍රව්‍ය මිලදී ගැනිම සඳහා යෝජනා කරමි.**

**සභාපතිතුමා:-**

මේක මං හිතන්නේ අපි හැමෝම වසම්වලට සියලුම මන්ත්‍රිවරුන්ට තම තමතමන්ගේ වසම්වලට තම තමන්ගේ කොට්ඨාශවලටමහජනයාගේ ඉල්ලීම් කරන දෙයක්,ඉතින් ඒක හින්ද තමයි මම මේ යෝජනාව ඉදිරිපත් කළේ.මන්ත්‍රීවරුන්ට පුළුවන් ඒ ගැන යෝජනා තියෙනව නම් ඉදිරිපත් කරන්න.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ඔබතුමා ඉසිරිපත් කරන ලද මේ යෝජනාව ඇත්තටම ඇහැලියගොඩට තදබල ප්‍රශ්නයක්ව තියෙන මේ විථී ලාම්පු ප්‍රශ්නය මං හිතනවා හැකි ඉක්මන්ට විසඳිය යුතු ප්‍රශ්නයක් හැටියට සලකා ඔබතුමා ගෙනා ඒ යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපතිතුමා මහේෂ් රත්නායක මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, ඇත්තට ම ඉතා ම කාලෝචිත යෝජනාවක් අපි දන්නවා අපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඉතා විශාලයි.වසම් 44 ක් තියෙනවා. ඒ වසම් 44 ම **අතුරුමාර්ග,මහා මාර්ග,** වසම් සම්බන්ධ කරන මාර්ග ,මංසන්ධි ඒ හැම එකක් ම තියෙනවා.ඇත්තටම රාත්‍රී කාලයේ දී ඉතාම අනනතුරුදායකයි. ඒ හැම කෙනා ම රාත්‍රී

කාලයේ දී නිවෙස්වලට යන ඒ හැම කෙනා ම සැහෙන පීඩාවට පත් වෙනවා මේ වීථි පහන් වලින් එන ආලොකය නැති නිසා මං හිතන්නේ ඒ සම්බන්ධවයෙන් තියෙන ඉල්ලීම් අපේ හැමදෙනාටම මන්ත්‍රීවරු හැම දෙනාටම ඒ සම්බන්ධව අදහස් යෝජනා පැමිණිලි ඇති.දැන් අපි යෝජනා කරන්නේ මේ විදුලිබලය කියන්නේ දැන් අපිට අභියෝගයක්.ඇත්තට ම ගත්තොත් ප්‍රාදේශීය සභාවේ දැනටමත් විදුලිබිල් 20 ක් පමණ තියෙනවා ඔක්කොම.එතකොම ඒ වගේම අපට වීථි පහන් වලටත් සීමාවක් තියෙනවා.මේ නි නිසා අපි අපේ අදහස තමයි මේ **පුනර්ජනනීය** බල ශක්ති යෝජනා ක්‍රමය.පාවිච්චි කරගෙන අපිට වීථි පහන් වලට අපිට ඒවා ස්වංක්‍රීයව දැල්වෙන ඒවා පාවිච්චි කරන්න පුළුවන්නම් අපිට පුළුවන් වීථි පහන්වලට යන විදුලි බලය විථි පහන් සඳහා යන රටේම විදුලි බලය අපිට පිරිමසා ගන්න ඒ වගේ ම අපිට ප්‍රශ්නයක් තියෙනවා අපි අපිට ඉල්ලීම් කරලා මේ වීථි පහන් දාගන්න කලින් කොපමණ ඉල්ලීම් කරල ඊට පස්සේ විථි පහන් දාගත්තත් ඒක ඊට පස්සේ ඒක නිමන්න ඊටපස්සේ රැට දාන්න ඒවගේම උදේ පාන්දර නිමන කාර්ය ගොඩක් තැන්වල වෙන් නෑ සාමාන්‍යයෙන් හවස එක දෙක විතර වෙනකන් ගොඩක් විථි පහන් පත්තු වෙනවා ඉතින් ඒක සෑහෙන විදුලි නාස්තියක් ඉතින් එකත් අපිට විශාල ප්‍රශ්නයක් ඒක අපට අවම කර ගන්න පුළුවන් රාත්‍රි කාලයේ දැල්වෙලා උදේට නිවෙන පහන් පාවිච්චි කරන්න පුළුවන් නම් මං දැකල තියෙනවා ඒ නිසාම අපි මේ මං හිතනවා මේ යෝජනාව අපට ඉතාමත් ම අත්‍යවශ්‍ය යෝජනාවක් මොකද අපේ ප්‍රාදේශීය සභාවේ ඉන්න මන්ත්වරු 36 දෙනාම අවාසනාවට පස් දෙනෙක් තාම නෑ නමුත් ඒ 31 දෙනාටම මේ සම්බන්ධව අපට මැදිහත් වෙන්න ඒ කියන්නේ අපේ මේ 36 දෙනාම ඒ ප්‍රශ්නය අදාළයි.අපි මේ ප්‍රශ්නය අදාළයි අපි ප්‍රාදේශීය සභාව විදිහට පොඩි ප්‍රතිපත්තියක් වගේ අනුගමනය කරොත් හොඳයි කියල හිතෙනවා.ඉල්ලන ඉල්ලන කෙනාට ම මේ කණුවෙත් දාල ඊළඟ කානුවෙත් දානවා එහෙම දෙන් නැතුව අත්‍යවශ්‍යම තැන් බලලා විශෙෂයෙන් ම මංසන්ධි අනතුරුදායක තැන් එක ළඟ ළඟ කණුවලට දාන් නැතුව විශෙයෙන් ම මංසන්ධි අනතුරුදායක තැන් ඇත්තට ම දැන් මත්ද්‍රව්‍ය ජාවාරම් තියල යනවා නැවත ගෙනියනවා අන්න ඒකටත් හොඳ මේක කාලෝචිත යෝජනාවක් මං හිතනවා සභාවේ මන්ත්‍රීරු මේ යෝජනාවට එකඟ වෙයි කියලා අපි හැමෝම පොදු ප්‍රතිපත්තියක ඉඳල මේ විථි පහන් සවිකරන ස්ථාන සම්බන්ධව අපි හැමෝ ම පොදු එකඟතාවයකට ඇවිල්ලා ඒ කියන්නේ ප්‍රමුඛතා අනුපිළිවෙලකට වසම්වල තියෙනවා ස්ථාන අන්න ඒ හදුනගෙන අපි හැමෝ ම ඒ විදිහට මේ වැඩේ සාර්ථක කරගන්න මැදිහත් වෙමු කියන අදහසත් මං මේ යෝජනාවට එකතු කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, උප සභාපතිතුමා ගෙනා යෝජනාවට දිගුවක් ලෙස මං මෙතන් දී එතුමා කිවුව වගේ ඒ කරුණට මං එකතු කරනවා දීර්ඝ කාලයක් පැවතෙන්න පුළුවන් ටෙන්ඩර් පටිපාටිය උපයෝගී කර ගෙන වැඩි ධාරිතාවයකින් වැඩි කාලයක් පාවිච්චි කරන්න පුළුවන් උපකරණ මිල දී ගන්නත් ඊට අමතරව දැන් රැහැන්මාර්ගයදාල තියෙන්නේ ගොඩක් ඇතින් විශේෂයෙන් ම බුළුගහපිටිය මාර්ගයේ රැහැන් ඇදල තියෙන්නේ වෙලක් හරහා එතන් දී එතකොට මේකට කණුවකුත් කණු මිල දී ගන්න සඳහා මෙතුමා කිවුව වගේ වීථි ලාම්පු දැනට පවතින වීථි ලාම්පු ටික මුලික අදියෙරේ දී අලුත්වැඩියා කටයුතු කිරීමට මෙතන දි ප්‍රවේශයක් ගන්න පුළුවන් නම් මෙතන දී ඉතා වැදගත් වෙනවා ඉතින් අර ප්‍රධාන වශයෙන් මං දිගුවක් එකතු කරන්නේ අතුරුමාර්ග වල යන කොට වෙල හරහා යන කොට අතුරු මාර්ගවලකණු නෑ බල්බ් හයි කරන්න එ කණුත් මිල දී ගැනී මට ඒ සඳහා ගන්න කියල මං ඔබතුමාට දිගුවක් ලෙස යෝජනා කරනවා

**සභික දිලින් කරුණාපාලමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි අපිටත් ඔය අපිටත් ප්‍රශ්න තියෙනවා අපේ ගම්වල විදුලි රැහැන් යන් නැති තැන්වලට අත්‍යවශයෙන්ම විදුලි ආලෝකය ලැබිය යුතු තැන් තියෙනවා මොකද ඒවායේ අතුරලිය මන්ත්‍රිතුමා ඒ ගැන තමා පැහැදිලි කළේ.මේ යෝජනාවේ තියෙනවා සෝල පැනල් වලින් LED බල්බ් පත්තුකරන එක ගැන ඒවගේ දෙයක් ඇත්තටම හොඳ ගොඩක් හොඳ යෝජනාවක්.අපිට ඊට අමතරව සෝල පැනල්වලින් පාවිච්චි කරන විදි ආලෝකය ගන්නකොට ඒවායේ කල්පැවැත් ම ගැන අපි ඉතාමත්ම සැලකිලිමත් වෙන්න ඕන.නැත්නම් අපිට ඒ සභාව විසින් දරණ වියදම ගැන මහජනතාවට දෝෂා රෝපණයක් ඇති කරන්න තියෙන ඉඩ කඩ වැඩියි.ඒ ගැන වැඩි සැලකිල්ලක් දක්වමු කියලා මං අදහසක් විදිහට ඉදිරිපත් කරන්න කැමතියි.

**සභික ජී.එච්.එස්.එන්.කේ.විජේසූරිය මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි මං හිතනවා ඔබතුමා අපේ සභාව පටන් අරගෙන ආරම්භයේ දීම ඉතාමත් කාලෝචිත වගේ ම සහ වටිනා යෝජනාවක් තමයි ඔබතුමා ඉස්සෙල්ලම ඉදිරිපත් කළේ.මං හිතන්නේ ඔබතුමාගේ මේ යෝජනාව ඓතිහාසික ගත වෙයි.මෙතන ඉන්න අපි 31 දෙනෙක් අපි නියෝජනය කරනවා.තව පස්දෙනෙක් එන්න ඉන්නවා සභාවට. මේ සැම සභිකයෙකුටම අපේ උපසභාපතිතුමා කිවුව ආකාරයට ගමේ ක්‍රියාරීන්

වෙන්න පුළුවන් මධ්‍යස්ථ මතධාරීන් වෙන්න පුළුවන් සෑම පුද්ගලයෙක් ම වීථි පහන් සම්බන්ධව ලොකු අවධානයක් යොමු කරනවා.සමහරවිට මේ වන විට ඔබතුමාට ඔබතුමාගේ කොට්ඨාශයෙනුත් කියල ඇති ඒක තමයි ඇත්ත හරි අපි මේ යථාර්ථයට මුහුණ දෙන්න ඕන.ඒ නිසා අපේ සියලුම අපේ උප සභාපතිතුමා ආරියදාස මන්ත්‍රීතුමා මන්ත්‍රීවරුන් පිරිසක් අපේ අදහස් ප්‍රකාශ කළ ආකාරයට අපි මේ කටයුත්තට මූලිකව ම මැදිහත් වෙලා අපේ දිලීන් මන්ත්‍රීතුමා කිවුවවගේ විනිවිද භාවයකින් යුතුව වැඩ කරලා අපි මේක මේ සම්බන්ධව කටයුතු කරන්න ඕන ඉතාමත් ම කඩිනමින් වැඩපිළිලෙළක් හදන්න ඕන.ඒක තමයි ඒක.

දෙවනි කාරණාව තමයි අපි මේ වන විට අපේ ලේකම් මහත්තයා මැදිහත් වෙලා වසම් 44 ම යම් විදියකට වීථි පහන් ආලෝකමත් කරල තියෙනවා.අපි එතුමට ස්තුතිවන්ත වෙන්න ඕන ඒක මන්ත්‍රි වුණා හෝ නොවුණා යම් යෝජනාවක් ගමෙන් ආවහම ඒක ඉස්ඨ කරල තියෙනවා ඒකට ස්තුති කරන්න අවස්ථාවක් කරගන්නවා මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ අපේ තුෂාර අතුරලිය මන්ත්‍රීතුමා කිවුව වගේ උදාහරණයක් ගත්තහම අපේ පාර ගත්තහම කවුරුත් දන්නවා ඔබතුමා මැතිවරණය වෙලාවේ ගියා ආරියදාස මන්ත්‍රීවරයා වෙනුවෙන් එතකොට ඔබතුමා දකින්න ඇති අපේ රුහැන් ගිහිල්ල තියෙන්නේ වෙල හරහා එතකොට අපිට ඒ හරහා ලයිට් දමන්න ප්‍රායෝගික වෙන්නේ නෑ.එතකොට අපි ඒ උදාහරණයක් ගත්තේ, වසම් 44 ටම මේ ගැටලුව මතුවෙන්න පුළුවන් .එතොකොට අපේ අතුරලිය මන්ත්‍රීතුමා කිවුව වගේ ගරු සභාපතිතුමනි ඒඒ තැන්වලට ප්‍රමුඛත්වය දිල හඳුනාගෙන කණුවක් එතුමාගේ යෝජනාව තවත් වැඩි දිගුවක් ලෙස ප්‍රකාශ කරන්නේ ඒ නිසා ඔබතුමා එයට මැදිහත් වෙන්න ඕන.

ඊ ළඟට දැන් අපි දාල තියෙනවනේ වීථි පහන් වසම් 44 ටම යම් යම් ප්‍රමාණ වලින් ඒ සම්බන්ධව ඒවා එක පාරටම අපිට විධිමත් කරන්න බැරි වෙයි ඒ ගැනත් අවධානය යොමු කරමින් ඔබතුමාගේ අදහස ඉදිරිපත් කරල තියෙන  එක අනුමත වුණා අදහසක් හැටියට ඔබතුමාටත් කියන්නේ අපි ඉතාමත් කඩිනමින් ඒ දේ කරන්න අපේ පූර්ණ සහයෝගය ලබා දෙනවා බොහොම ස්තුතියි.

**සභික  ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි මේ වීථි ලාම්පු LED සෝලා විදුලි ලාම්පු සවි කිරීමේදී පැන නගින ප්‍රධාන ගැටලුව තමයි විදුලි ලාම්පු කොච්චර කාලයක් දැල්වෙනවාද කියන එක දවල් සූර්ය එළියෙන් ලැබෙන බලය කොච්චර වෙලා පත්තු වෙනව ද කියන එක.

ගරු සභාපතිතුමනි දැනට Mraket එකේ තියෙන සෝලා විදුලි ලාම්පුවල ඔවුන් දෙන කාලය තමයි පැය 10 ක් තමා මේක දැල්වෙනවා කියන්නේ එතකොට පැය 10ක් කියන්නේ ප්‍රායොගිකව අපේ වගේ වර්ෂාව තියෙන පැතිවල පැය 6 ක් වගේ වෙන්න පුළුවන් එතකොට අපි මිල දී ගැනීමේ දී  අපි අපේ තාක්ෂණ නිලධාරීන් ලව්ව අපි  හොයා ගන්න ඕනේ මේක පැය 12 ක් පත්තු වෙන අවම වශයෙන් පැය 12 ක් එයාල පැය 12 Cetyfiy කරන වීථි ලාම්පු තියෙනව ද කියන එක එතකොට ගරු සභාපතිතුමනි එහෙම නොවුනොත් අපේ මගේ ගෙදරත් දාල තියෙනවා මට දුන්නෙත් පැය 10  පත්තු වෙනවා කියල තමයි හැබැයි රෑ දොළහ එක වෙනකොට මේ ලයිට් එක off වෙලාඉවරයි.මේක ලංකාවේ ප්‍රසිද්ධ නමකින් තමයි තියෙන්නේ.හැබැයි අපට හොයා ගන්න පුළුවන් නම් මාර්කට් එකේ හොයා ගන්න පුළුවන් නම් තාක්ෂණික නිලධාරීන් ලව්වා  පැය 12 දක්වා මං අහල තියෙනවා කියලා අපට ඒ තත්ත්වයකට යන්න පුළුවන්නම් ඒක හොඳ වෙයි කියලා මොක ද අපට ලැබෙන ටෙන්ඩර් එකේ දී සමහරවිට මිලට වඩා අපි Qulutiy එක සම්බන්ධව පොඩි යෝජනාවක් මං ඉදිරිපත් කරන්න කැමතියි.

ඒවගේ ම ගරු සභාපතිතුමනි අපේ උප සභාපතිතුමා යෝජනා කළා මේ කොට්ඨාශ මට්ටමින් අපේ අවශ්‍යතාවන් හඳුනගෙන අපි ඒ අවස්ථාව ලබා දෙමු කියලා වීථි පහන් සවි කරමු කියන එක ඉතින් අපේ විපක්ෂයේ ඉන්න මන්ත්‍රීන්ගේ බහුතරයක් කොට්ඨාශ නියෝජනය කරල ඡන්ද ඉල්ලුවත් හැබැයි දැන් පත්වෙලා ඉන්නේ ලැයිස්තු මන්ත්‍රීවරු විදිහට ඉතින් මං ගරු සභාපතිතුමාගේ විශේෂ ඉල්ලීමක් කරනවා මේක මේ බෙදිදි අපේ  විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ටත් දෙන්න කියලා අපිට කොට්ඨාශයක් නෑ විපක්ෂයේ ඉන්නේ කොට්ඨාශ ජයග්‍රහන කරල ඉන්නේ දිලින් මන්ත්‍රිතුමා විතරයි එතකොට අපේ අවශ්‍යතාවය අපෙත් ඉල්ලීම් තියෙනවා මොක ද අපි සියලු දෙනාගේම ගම්වල ඉන්න ඥාති හිතමිත්‍රාදීන් තමයි අපි මේ දෙපැත්තකට බෙදිල තමයි මැතිවරණ වලදී ඡන්දය ලබා දීල තියෙන්නේ ඉතින් ඒ හින්ද මම ගරු සභාපතිතුමාගෙනුයි උප සභාපතිතුමාගෙනුයි සභාවෙනුයි විශේෂ ඉල්ලිමක් කරනවා මේක කොට්ඨාශ පදනමින් හා මේ විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ටත් විශේෂ අවස්ථාවක් ලබා දෙන්න කියලා මේ වීථි ලාම්පු සවි කිරීමේ දී  ඔච් 36 දෙනාටම සාධාරණ විදිහටත් ඒ එතකොට තමන්ගෙ කොට්ඨාසෙ අපි ප්‍රායෝගිකව දැන් අපේ මන්ත්‍රිතුමන්ලා කොට්ඨාශ මන්ත්‍රීවරු වෙන්න පුළුවන් හැබැයි විපක්ෂයේ මන්ත්‍රීට යම් ගැටලුවක් ඇතිවෙන්න පුළුවන් ඒ හින්ද ඒ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කරන මෙන් මං ගෞරවයෙන් ඉල්ලා සිටිනවා

**සභාපතිතුමා:-**

බොහෝම ස්තූතියි අර මුලින් අපේ විශේෂ මංගල විශේෂ රැස්වීමේදී කිවුව වගේ අපේ පක්ෂ විපක්ෂ කියල අපි භේදයක් නෑ 36 දෙනා ම අපි ඒ මොකක්ද දෙන වරප්‍රසාදය ඒක සභාවේ ඉන්න ඔක්කොට ම දෙන්න උපරිම උත්සහයක් ගන්නවා.

ඒ අනුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ විථි පහන් අලුත්වැඩියා කළ යුතු බැවින් සාමාන්‍ය විදුලි රැහැන්වලට සම්බන්ධ කරන විථි පහන් මෙන්ම ස්වංක්‍රියව ක්‍රියාත්මක වන LED පහන් අතුරු මාර්ගවල මංසන්ධි සඳහා සූර්යකෝෂ මඟින් සාමාන්‍ය විදුලි රැහැන්වලට සම්බන්ධ කරන විථි පහන් මෙන්ම නියමිත ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් වීථි පහන් හා ඊට අදාළ ද්‍රව්‍ය මිලදී ගැනිම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**

මී ළඟට

**II.ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා ප්‍රධාන කාර්යාලය,ඇහැලියගොඩ සතිපොල,බේරුවාන කසල අංගනනය,හා විලේගොඩ ආදාහනාගාරය සඳහා නියමිත ප්‍රසම්පාදන කාර්යය මත ක්‍රියා කරමින් CCTV පද්ධතිය සවි කිරීම සඳහා මිලදී ගැනීමට යෝජනා කරමි.**

**සභාපතිතුමා:-**

මෙය කියනව නම් ඇත්තටම මේක අපේ මන්ත්‍රීවරුන්ට හිතන්න පුළුවන් ඇයි මෙච්චර තවම ප්‍රාදේශිය සභාව තුළ අඩු පාඩු ගොඩක් තියෙද්දී ඇයි මේ CCTV පද්ධතියක් අපි පළවෙනි මහා සභාවෙන්ම අපි යෝජනා කරන්නේ කියලා ඇත්තටම මේකෙන් සාමාන්‍ය ප්‍රශ්න ගොඩක් නිරාකරණය වෙනවා ඔයාල ටවුමේ අය කවුරුත් දන්නවා රාත්‍රී හය හත වෙන කොට තියෙන අපචාර ඒ වගේ ම පොළ භූමියට ගියත් එහෙමයි අපේ කසල අංගනයට ගියත් එහෙමයි ඒ වගේම සමහර සෞඛ්‍ය කම්රුවෝ වැඩට එනවා ඒ ගොල්ලො නම් දානවා ඒ ගොල්ලෝ යන තැනක් හොයා ගන්න බෑ සමහර විට තුන්දෙනෙක් සේවයට වාර්තා කරපුවහම ඉන්නේ කීප දෙනයි ලොකු ගැටලුවකට මුහුණ දෙන්න සිද්ධ වෙන නිසා තමයි මම මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ ඔයගොල්ලන්ට අදහස් දක්වන්න පුළුවන්.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:**

ගරු සභාපතිතුමනි මං හිතන්නේ සභාපතිතුමා ගෙනා යෝජනාව මං හිතන්නේ කාලෝචිත යෝජනාවක් මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

ඒ වගේම ඒ යෝජනාවට දිගුවක් ලෙස මං එකතු කරනවා මං හිතන්නේ අපේ ප්‍රදේශයේ තමයි තියෙන්නේ මේ ආදාහනාගාරය එ මං හිතන්නේ ආදාහනාගාරයේ විශාල අඩුපාඩු ප්‍රමාණයක් තියෙනවා මං හිතන්නේ මේ යෝජනාව ස්ථිර කරන ගමන් මං කියනවා මං හිතන්නේ ඇත්තටම අපට පුළුවන් නම් ඒ ආදාහනාගාරයේ තියෙන අඩු පාඩු ටිකත් මෙම යෝජනාවට ම එකතු කරන්න විශේෂයෙන් ම මං හිතන්නේ ආදාහනාගාරයේ සනීපාරක්ෂක පහසුකම් අඩුයි ඉතින් ඒක සපයන්න ඕන ඒ වගේ ම තමායි ආදාහනාගාරයේ තවම යට බිම ටයිල් කරල නෑ ඒ වගේ අඩුපාඩු ටිකක් තියෙනවා ඒ ටික කරන ගමන් මං හිතනනේ අපට නිතරම ආදාහනාගාරයේ සේවකයින් ගෙන් ලැබෙන ප්‍රශ්න තමයි මං හිතනනේ එතන ආදාහනාගාරයේ සේවකයින් දෙදෙනයි ඉන්නේ මං හිතනනේ එක් කෙනෙක් අසනීප වුණොත් අපිට එක මිනියක් පුච්චගන්න බැරි වෙනවා මොකද ඒ කියන්නේ තනි කෙනෙකුට කරන්න අමාරුයි ඉතින් ඒ නිසා අපි තාවකාලික හරි එක් සේවකයෙකු තව ලැබෙනව නම් හොඳයි මම පොඩ්ඩක් අධ්‍යනය කරල බැලුවහම අනෙක් අදාහනාගාර වල සාමාන්‍යයෙන් සේවකයින් හතර දෙනෙකු ඉන්නවා ඉතින් අපිට තුන්දෙනෙක්වත් ඉන්නව නම් මං හිතන්නේ ඒ ගොල්ලන්ගේ අපහසුතාවය ඒකෙන් අඩු වෙනවා ඒ වගේ ම විශේෂයෙන් ම අර සනිපාරක්ෂක පහසුකම්වල ගැටලුවකුත් තියෙනවා මොක ද අපි එන කෙනෙකුවත් යන්න පොදු වැසිකිලියක් නෑ තියෙන්නනේ පොඩි වැසිකිලියක් ඒකත් ඉතින් මදි මං හිතන්නේ ඒ වගේ මේ යෝජනාව ස්ථිර කරමින් මං හිතන්නේ ඒ අවශ්‍ය අඩුපාඩු ටිකත් සපයා දෙනවනම් හොඳයි කියන ඉල්ලීම මම කරනවා.

**සභාපතිතුමා:-**

බොහොමත් ම ස්තූතියි.

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මෙතන දී සනීපාරක්ෂක පහසුකම්වල අඩු පාඩුව ලොකුවට දැනෙනවා යම් කිසි අවස්ථාවක අසනීපයක් වුණොත් ආදාහන කටයුතු මෙහෙයවන නිලධාරියාට එදිනට ආදාහන කටයුතු කරන්න වෙන් නෑ

නොපැවැත් වූ අවස්ථා බොහොමයක් තිබුණා ඉදිරියේදීත් ඒ කටයුතු එසේම වෙන්න පුළුවන් ඒ සඳහා ප්‍රමුඛතාව දීල කටයුතු කරන්න පුළුන්නම් වඩාත් කාලෝචිතයි කියල මම යෝජනා කරනවා.

.

**සභික එච්.එස්.එල්.දීපාල්මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, ඒම යෝජනාවට මං එකතු කරනවා සභාපතිතුමනි, ගැටහැත්ත පොළ,කරඳන පොළ,තොරණගොඩ ගබඩාව තියෙනවා,තව කොහිලදෙනිය ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය.ඊට පස්සේ ඒකටත් CCTV සවි කළොත් කැමරා සවි කළොත් හොඳයි කියලා යෝජනා කරනවා.

**උපසභාපතිතුමා මහේෂ් රත්නායක මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි ඔබතුමාගේ යෝජනාව ඉතා ම හොඳ යෝජනාවක් අපිට ප්‍රාදේශී සභාව ලෙස කියලා සැලකෙන්නේ නේ මේ ප්‍රදේශය බල ප්‍රදේශයේ කාර්යයන් විධිමත් කරන එක ඒවා තව ඵලදායී කරන එක කාර්යක්ෂම කරන එක ඒත තමයි අපට ඇහැලියගොඩ ප්‍රදේශය සභාව වෙනුවෙන් පැවරිලා තියෙන්නේ මොක ද එතකොට අපේ මේ තියෙන කාර්යයන්වල මූලික එකක් තමයි මේ කසල එකතු කිරීම අපේ මේ පොදු උපයෝගිතා සේවාන් ටික වඩාත් කාර්යක්ෂම කරන්න ඒ වගේ ම ඒවාට වගවීම ඒක තව වර්ධනය කරන්න මේ යෝජනාව ඉතාමත් ම එකට දායක වෙයි කියලා ඉතින් ඒ නිසා මේ ප්‍රධාන ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ අපේ දැනට තියෙන පොදු උපයොගිතා සේවාවල ප්‍රධාන මරමස්ථාන දෙක ඒ කියන්නේ ඒ යෝජනාවේ තියෙන ඒවාගේ අපේ හැම එකටම නියමිත ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් ඒ වගේම කල් පවතින අපි දකිනවා අපි කරනවා සවි කරනවා ඒවා මාසෙන් දෙකෙන් අකාර්යක්ෂම වෙලා යනවා වගකීමක් සහිතව අවුරුදු දෙක තුනක ඒ කියනනේ සේවා වගකීමක් තියෙන අඩුම තරමින් අවුරුද්දක් හෝ දෙකක් නිශ්පාදන භාණ්ඩවල වගකීමක් අඩුම තරමින් අපේ ධූරකාලය අවසන් වෙනකන් ඒ සේවාව වගකීමක් වගේ ඒ සියල්ල බලලා අපි මේ ප්‍රසම්පාදන කටයුතු සිදු කරල මේ කාර්ය ඉතාම සාර්ථක කර ගමු. මොක ද එතනින් පස්සේ අපට තියෙනවා ලොකු වැඩ ටිකක් කරන්න අපේ කලින් කරුණාරත්න මන්ත්‍රීතුමත් පැහැදිලි කපු විදිහට එතුමා අදහස් කරන්න ඇති කොට්ඨාශ මන්ත්‍රිවරුන්ට විතරක් කිවුව කියල නමුත් එහෙම නෑ අපි හැම දෙනාම එකම මන්ත්‍රිවරු එතන අපට වගකීමක් තියෙනවා කොට්ඨාශ මන්ත්‍රිවරයට කොට්ඨාශ මන්ත්‍රීවරුන්ට කොට්ඨාශවෙනුවෙන් නමුත් අනිත් මන්ත්‍රිවරුන්ටත් පුළුවන් ඔවුන්ගේ සභා බල ප්‍රදේශයේ ම ඔවුනුත් ඡන්දය අරගෙන තමයි ආවේ පසුගිය සභාවාරයේ දී කිවුවේ මුළු සභාවෙ ම මොකද මම දන්නවා ඒකෙ වගකීම ඒ නිසා අපි කිසිසේත් ම සභාපතිවරයාගේ දකුණු පස මන්ත්‍රීවරු හැටියට අපි කිසිසේත් ම ඒ වෙනසක් කරන් නෑ ඒ නිසා අපි එහෙම කරන් නෑ ඒ නිසා අපි අපේ සභාපතිවරයාගේ යෝජනාවට මගේ අදහස් ඉදිරිපත් කරනවා.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි මේ යෝජනාවට මං අදහසක් ඉදිරිපත් කරනවා මේකෙන් අපි බලාපොරොත්තු වෙනව නම් යම්කිසි ඵලදායිතාවයක් බලාපොරොත්තු වෙනව නම් ඒක වෙන් නෑ ඒක නෙමෙයි මේකෙන් සිද්ධ වෙන්නේ සභාවට මේක වැදගත් වෙනවා ඒ වුණාට මේක සතිපොල ඊට පස්සේ මේක හයිකරල සති දෙක යනකොට මේක කඩල දානවා ඒකට අඩුම තරමින් මේක වෙනුවෙන් තව කවුරුහරි දාන්නවත් වෙනවා මොකද අපි දන්නවා CCTVකැමරා දැන් අපේ ඉස්කෝලවලට හයිකරල තියෙන්නේ තියෙනවා ඒ හයිකරල තිබුණට මේකේ විශේෂයෙන් ම මේ හොරු ඊට පස්සෙ කුඩුකාරයෝ මේකෙ ඉන්න මේ වැරදි වැඩ කරන මිනිස්සු ටිකට ඒක ගැටලුවක් වෙනවානේ හැබැයි මේක බැලුව කියල අපි මේකෙන් කොතනකවත් මම හිතන්නැ නිත්‍යානුකූලව ක්‍රියාමාර්ග අරගෙන ඇති කියලා.ඉතින් අපි වියදම් කරන තරමට අපට ඵලදායී වෙන්න ඕන කියල තමයි මං දකින්නේ ඒක හින් ද මේක ආරක්ෂා කර ගෙන මේක කරන්න පුළුවන්නම් මේක බලල ඉවර වෙලා දැන් වැඩ කරන මිනිස්සු අපි මෙකෙන් බලලා ඉවර වෙලා හිටන් ඒ මිනිස්සු යන්නේ කොහෙද අරෙහෙ මෙහෙ කියන ඒක නෙමේ වැදගත් වෙන්නේ ඒ මිනිස්සු කාර්යක්ෂම කර ගැනිම සඳහා ඒ මිනිස්සුන්ට තියෙන ගැටලු මොනව ද හදුනා ගෙන ඒ මිනිස්සු වෙනුවෙන් අපි යම් ප්‍රතිලාභයක් ලැබෙන්න සල සලා ඒ මිනිස්සුන්ව සතුටු කරන්න ඕන ඒ සතුට තුළින් අපි ඒ මිනිස්සුන්ගෙන් වැඩ කරව ගන්න උත්සහ කරමු මේ වගේ දේක මම දකින්නේ අපට වැදගත් තැන් කිපයක් තියෙනවා මේකෙ ඒකට අපි භාවිතා කරමු අනවශ්‍ය තැන්වලට භාවිතා නොකර ඉමු.

**සභික දිලීන් කරුණාපාලමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි එතුමා කිවුව වගේ අපි මෙතන දී CCTV පාවිච්චි කරන්නේ තාක්ෂණය උපයෝගී කර ගැනීමක් විදිහටයි අත්තටම ලංකාව වැනි රටක ආකල්ප සංවර්ධන කරන්න තමයි අපි සභාවක් විදිහටත් නායකයො විදිහටත් උත්සහ කරන්න ඕනේ අපිට පුළුවන්නම් CCTV නැතුව එතන හොරකම නාස්තිය වංචාව දූෂණය නැති කරන්න අන්න එදාට තමයි ශිෂ්ට සම්පන්න සමාජයක් අපිට බිහි කරන්න පුළුවන් මගේ නම් පෞද්ගලික අදහස ආකල්ප සංවර්ධනය තුළින් ජනතාව ඉස්සරහට ගෙනියන්න තමයි අපට ගොඩක් වෙලාවට කුණු ප්‍රශ්නය වුණත් ආකල්පමය තුළින් හොඳ වර්ධනයක් තිබ්බ නම් ජනතාව විසින් ම මේ කුණු ප්‍රශ්නට උත්තර හොයා ගන්නවා.

දැන් අද උදේ ආරංචි වුණා මට තොරණගොඩ ප්‍රදේහයේ ගලිවුසරයක් ඇවිල්ල ඒ ගලි දාල කියලා ඒක හරිම අශෝබන ක්‍රියාවක් හොඳම නැති ක්‍රියාවක් කරුණාකරල මම මෙතන දී අදාළ නැති වුනත් මේ වීඩියෝ අපට

එවල තියෙනවා මොනව ද මේ කරන්නේ කියලා අපට බැනලත් එවලා තියෙනවා සභාපතිතුමනි මේකට මැදිහත් වෙන්න මීට කීපවතාවකටම පෙර ඔය අපේ මෝරගලයි ඇහැලියගොඩයි අතර මැද තියෙන ඇළට කීප අවස්ථාවක ම ගලිදාල කියල මිනිස්සු විසින් චෝදනා කරා නමුත් අපට ඒ ගැන මැදිහත් වෙන්න අවස්ථාවක් එවකට අවස්ථාවක් තිබ්බෙ නෑ දැනට අපිට සක්‍රියව සභාවක් විදිහට මැදිහත් වෙන්න අවස්ථාවක් තියෙනවා නමුත් අද සිද්ධිය ගැන හොයල බැලුවහම මීට කලින් සිදු වුණු සිද්ධි ටිකත් අපිට සනාථ කර ගන්න පුළුවන් CCTV මං දන්න විදිහට අර වංගුවේ කැදැල්ල සනත් මහතාගේ CCTV එතන තියෙනවා එතනින් බැලුවොත් අපට පුළුවන් කවුද මේක දැම්මේ කරන්නේ මොනවද කියලා මට ආරංචි විදිහට මේක නම් නිල් පාට ගලිබවුසරයක් මේ ආරංචි විදිහට අව්ස්සාවෙල්ල පැත්තෙන් තමයි ඇවිල්ලා තියෙන්නේ අපි දන්නැ කාගෙද කින්ද මන්ද කියලා හැබැයි ඔබතුමා මේකට මැදිහත් වුණොත් ඒ ප්‍රශ්නය විසදන්න පුළුවන් මේ ඒකත් දීර්ඝ කාලීන විසඳුමක් දෙන්න වෙයි මොකද නැත්නම් ගලි අපද්‍රව්‍ය දාන්න තැනක් නැති හින්ද තමයි ඔහේ හලලා යන්නේ පෞද්ගලික සේවාවක් කරන ආයතනයක් වෙන්න පුළුවන් හැබැයි ඒක පරිසරයට මුදා හැරීම කිසිසේත් ම අනුමත කරන්න බෑ ඒකත් මේ අවස්තථාවේ දී ප්‍රකාශ කරන්න කැමතියි.

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණිය :-**

ගරු සභාපතිතුමනි ඔබතුමාගේ යෝජනාවට දිගුවක් ලෙස මම ඒකට එකතු කරන්න කැමතියි කසල කළමණාකරණය පිළිබඳ යම්කිසි වැඩසටහනක් ක්‍රියාත්මක වෙනව නම් හොඳයි බේරුවාන උඩුමත්ත වසම වගේ ම මෙන්ම බොපැත්ත වසමට ලොකු ව්‍යවසනයක් විදිහට තමයි කාලෙකට මැස්සො කරදරේ පුංචි දරුවන්ට ආහාර වේලකටවත් ගන්න බැරි තත්ත්වයකට ඒ කසල ගොඩ ගැසීම හේතුවෙන් එතන යම්කිසි ගැටලුවකට මුහුණපාල තියෙනව ඒ ඉතින් මම යෝජනා කරනවා ඒ කසල ටික ඔතන්ට ගෙනාවට පස්සේ යම්කිසි වැරදි ක්‍රියාවක් විදිහට එතන තියෙනවා මොක ද ජලාශය ඉතාමත් ම හොඳින් නාන පරිශ්‍රයකට තමයි ඒ කසල ගොඩ ගැසීම සිදු කරලා තියෙන්නේ ඒ කසල ගොඩ කිරීම නිසා දැන් නාන තත්ත්වයක් එතන ඇත්තේම නෑ කුඹුරුවලට අක්කර 4 ක් අවුරුදු ගණාවක් තිස්සේ කිසිසේත් ම ගෙවිතැන් කරන් නැති තත්ත්වයකට පත් වෙලා තියෙනවා අපි ගොවිමහත්වරු දැනුවත් කරාම කියන්නේ මේ කුණු කන්ද නිසා හෝදන් එන ඒ අපද්‍රව්‍ය විශබීජ තියෙන නිසා තමයි මේ ගොවිතැන් කටයුතු කරන් නෑ කියන එක ඉතින් ගරු සභාපතිතුමනි බල්ඛ් හයි කරනව වගේම යම්කිසි කළමනාකරණයක් ප්‍රතිචක්‍රිකරණ වැඩසටහනක් මේ කසල අංගනයටත් ලබා දෙනව නම් උචිතයි කියල යෝජනා කරනවා මේ සභාව තුළින් ස්තුතියි.

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය :-**

සභාපතිතුමනි ඒකට දිගුවක් විදිහට මම යොජනා කරනවා බෝපැත්ත වසමේ කුණු ට්‍රැක්ටර් ටික යනකොට අතන මේ පාලම ගාව එතන ඇත්තටම ඒ යන මේ පාලම ගාව එතන ඇත්තටම ඒ යන තැන තියෙන ගැටිති එක්ක තමයි ඒ එතන විශාල විදිහට කුණු හැලිලා තියෙනවා මං හිතන්නේ අදත් ඒ තත්ත්වයම තිබුණා එකත් මං මේ වෙලාවේ මතක් කරනවා ඒත් එක්ක ම කුණු වලක් කිවුවට කුණු කන්දක් මං හිතන්නේ ළඟම ඉන්නේ මම මං හිතන්නේ ඒක හින්ද මේ මම දන්න විදිහට ප්‍රාදේශීය සභාවෙන් මේ වනවිට මැස්සන් බෝවීම වලක් වන්න සඳහා බෙහෙත් ගහනවා කාලයක දී තමයි ඒක වෙන්නේ එකත් මේ එකක් ඇත්තටම මේකට මොනව හරි දෙයක් කළ යුතුයි කියලා යෝජනා කරනවා.

**සභාපතිතුමා:-**

විශේෂයෙන් ම සඳහන් කරනවා අපිට කථා කරන්න තියෙනවා ගොඩක් මාතෘකා.ඒක හින්ද අපි මේ කතා කරන මාතෘකාවට අදාළ CCTV කැමරා සවිකිරීම අදාළ මාතෘකාවට පමණක් අපි මේක කතා කරමු අනෙක් කාරණා වෙන වෙනම කථා කරන්න අවස්ථාව තියෙයි එහෙම කරමු නැත්නම් අපිට මේ න්‍යාය පත්‍රය අද ඉවර කරගන්න බැරි යි ඒක මං පොඩ්ඩක් මතක් කරනවා

ඒ වගේ ම ඉස්සෙල්ලා සමන්සිරි මන්ත්‍රීතුමාගෙන් යෝජනා කළා එතන අඩුපාඩු රැසක් තියෙනවා කියලා ආදාහනාගාරයේ ඒකට ඊයේ මම අත්සන් කරල යැවුවා අපිට ඒකට ප්‍රතිපාදන වගයක් හම්බෙලා තියෙනවා අපි මීට ඉස්සෙල්ලා යෝජනා කරපු ඒකක් ඒ පළාත් සභාවෙන් ඒක හින්ද ඒකට අවශ්‍ය කරන ටයිල් ටික අල්ලන්න ටෙයිලට් පද්ධතිය නවීකරණය කරන්න ඊට පස්සෙ දොරක් ගැස් කාමරයේ දොරක් ගැස් කාමරයේ දොරක් පිටතින් සවි කරන්න ඒක හින්ද ඔබතුමා ගෙනා ඒ යෝජනාව අපි ඒක ඒකට අපිට මුදල් ප්‍රතිපාදන ලැබිල තියෙන නිසා ඒ යෝනාව මම ඊයේ එක අදාළ තැන්වලට යොමු කළා.

ඊට පස්සේ අපේ අර කීව වගේ සේවකයො යොමු කරන්න මේ ගොල්ලො කොහෙද යන්නේ කියල බලන්න නෙමෙයි ඒක අපිට තවම අදහස් ඉදිරිපත් වීම හොඳයි නමුත් මන්ත්‍රීතුමා කිවුව වගේ තාම මිනිස්සු අපේ රටේ මිනිස්සු ඒ තැනට යොමුවෙලා නෑ ඉතින් අපට තියෙන තාක්ෂණය අපි ගත්තොත් හොඳයි මොක ද ඇත්තටම මං පුද්ගලිකවත් දන්නවා CCTV කැමරා නැතත් කැමරා සවිකර ඇත යන්න දැම්මහමත් හොරු එන්නෙනැ ඒක මම දන්නවා ඒක හින්ද අපි එහෙම කරමු බොහොම ස්තුතියි.

ඒ අනුව ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා ප්‍රධාන කාර්යාලය,ඇහැලියගොඩ සතිපොල,බේරුවාන කසල අංගනනනය,හා විලේගොඩ ආදාහනාගාරය සඳහා නියමිත ප්‍රසම්පාදන කාර්යය මත ක්‍රියා කරමින් CCTV පද්ධතිය සවි කිරීම සඳහා මිලදී ගැනීම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය .

**සභාපතිතුමා:-**

එහෙනම් බොහොම ස්තුතියි.ඊළඟට අංක තුන

**සභාපතිතුමා:-**

**III. ප්‍රාදේශිය සභා අරමුදලින් වියදම් දැරීමෙන් පසු ගෙවීම් කිරීමේ දී චෙක්පත්වල පළමු අත්සන ලෙස ලේකම් වන තලත්තානි රාලලාගේ චන්දන කුමාර ගුණසේකර මහතාට හා දෙවන අත්සන් කරු ලෙස ප්‍රධාන කළමණාකාර සේවා නිලධාරී වන සල්පිටි කෝරලලාගේ අනුෂා රෝෂණී මහත්මිය වෙත බලය පැවරීමට යෝජනා කරමි.**

**උපසභාපතිතුමා මහේෂ් රත්නායක මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව ප්‍රාදේශිය සභා අරමුදලින් වියදම් දැරීමෙන් පසු ගෙවීම් කිරීමේ දී චෙක්පත්වල පළමු අත්සන ලෙස ලේකම් වන තලත්තානි රාලලාගේ චන්දන කුමාර ගුණසේකර මහතාට හා දෙවන අත්සන් කරු ලෙස ප්‍රධාන කළමණාකාර සේවා නිලධාරී වන සල්පිටි කෝරලලාගේ අනුෂා රෝෂණී මහත්මිය වෙත බලය පැවරීම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා:-**

අංක හතර වන යොජනාව

**IV. ප්‍රාදේශීය සභා රැස්වීම්වලට සහභාගී වීම වෙනුවෙන් සභිකවරුන්ට මාසිකව ගෙවිය යුතු යැපීම් හා ගමන් වියදම් දීමනාව ලෙස ගෙවිය යුතු මුදල රු.8000.00 ක් ලෙස යෝජනා කරමි.**

**සභාපතිතුමා:-**

දැනට පාළාත් පාලන වලට උපරිම මුදල මේ 8000.00

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝමමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි ඒ යෝජනාව මං ස්ථිර කරනවා.

ඒ අනුව ප්‍රාදේශීය සභා රැස්වීම්වලට සහභාගී වීම වෙනුවෙන් සභිකවරුන්ට මාසිකව ගෙවිය යුතු යැපීම් හා ගමන් වියදම් දීමනාව ලෙස ගෙවිය යුතු මුදල රු.8000.00 ක් ලෙස වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා:-**

මම යෝජනාවක් කරනවා මහා සභා වාර්ථා ඉදිරියට Email හා Wattsapp මඟින් ලබා දීමට සභාවට යෝජනා කරමු.

**සභාපතිතුමා:-**

**V. මහා සභා වාර්තා ඉදිරියට Email හා Wattsapp මඟින් ලබා දීමට සභාවට යෝජනා කරමු**

**සභාපතිතුමා:-**

මේකෙන් ලොකු වියදමක් දැරීමට සිදු වෙනවා සභාවට මොකද අපි මන්ත්‍රීවරු 36 දෙනෙකුට මේ මහා සභා වාර්තාව අපි ගෙවල්වලට ගිහින් දෙන්න ඕන ගොඩක් ගත්තොත් අපිට හේවායින්න වගේ තැන්වලට බටහිර කලටුවාව වගේ යද්දි අපි සභාවේ වාහනයෙන් තමයි යන්නේ ඒක හින්ද ඒක අවම කරන්න තමයි අපි මේ යොජනා කරන්නේ ඊට අමතරව පුළුවන් අපට අකමැත්තක් නැත්තන් මේ වාර්තාව සභාවට ඇවිල්ලා ලබා ගන්න.

**සභික කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිණිය :-**

ගරු සභාපතිතුමනි මොකද මම ඒම යෝජනාව කාලෝචිත යෝජනාවක් Email හා wattsap මඟින් අපගේ සභා වාර්තාව හා අනෙකුත් නිවේදන කරනව නම් මොකද ඒකට මම ඒකට පොඩි අදහස් දැක්වීමක් කරන්නම් ඒක ස්ථිර කරන ගමන් මොකද මමත් කි.මි 14ක් විතර දුර ඉන්නේ අපේ රුවන්සිරි මන්ත්‍රීතුමා කරදන කි.මි. 28 ක් වගේ යන්න ඕන එතකොට සභා වාහනයකින් ගියොත් ලොකු වියදමක් දරන්න ඕන එතකොට ඒක මම හිතන විදිහට අපේ මේ සියලුම මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා ඒකට එකඟ වෙනව ඇති මොක ද අපේ සභාවේ වරිපනම් අපි සභාවේ වරිපනම් මුදල් අරපිරිමැස්මෙන් පාවිච්චි කරන්නව නම් අපි ඒවා පාවිච්චි කරන්න ඕන කියන අදහස මම හිතෙනවා මොක ද ලොකු වියදමක් අපි මොකද අපිට අපි කිපදෙනෙක් තමයි ගොඩක්ද දුර විදිහට ඉන්නේ අනෙක් මන්ත්‍රීවරු මං හිතන විදිහට ගොඩක් මේ අවට වගේ ඉන්නේ සභාවට ගොඩක් වෙලාවට එන්ඩ පුළුවන් මට්ටමක තියෙනව අපට වාර්තා සභාවෙන් ම වුනත් ටවුමට ආවොත් ගන්න පුළුවන් ඒ නිසා මම හිතනවා ඒ යෝජනාව කාලෝචිතයි මොක ද වියදම අඩු කර ගැනිම සඳහා හොඳ යෝජනාවක් ලෙස මම සඳහන් කරනවා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව කාලෝචිතයි බොහො ම හොඳයි හැබැයි ප්‍රායෝගික ගැටලු වෙන්න පුළුවන් බටහිර කලටුවාව වැනි ප්‍රදේශවල දුරකතන පහසුකම් අන්තර්ජාල පහසුකම් තියෙනව ද කියල ඒ ගැටලු ඇති වෙන්න පුළුවන් ගරු සභාපතිතුමනි මේක ඉස්සර මේ සභා වාර්තාව යන්නේ ලියාපදිංචි තැපෑලෙන් එතකොට අපිට මේක සභාවේ 36 දෙනාට ලියාපදිංචි තැපැලෙන් අපට ලබා දෙන්න පුළුවන්.රුපියල් 100.00 ක් හා රු.150.00 ක් විතර වෙයි තැපැල් ගාස්තුවකට යවන්න පුළුවන් එතකොට මේ Email හා wattsapp මඟින් ලබා දිම අපි ඒ සමඟම කර ගෙන යන් ලබන සභා වාරෙ

Email හා wattsapp එකෙන් දාන්වා ඒ වගේ ම පිසිකලි Document එකත් තැපැල් මාර්ගයෙන් යවමු එතකොට ඒකට ගරු සභාපතිතුමනි අපට මේකට මාස හයක් විතර කාලයක් මාස හයක් අවුරුද්දක් වැනි කාලයක් කරල බලමු මොකද මේක ප්‍රායෝගිකව හරි ද කියන එක පලීගලත් අපේ ගේ ගාවමයි ඉස්කෝලෙ තියෙන්නේ පලීගල ඉස්කෝලෙ ගාවටත් සිග්නල් නැ මගෙ ගමටත් සිග්නල් නැ සමහර වෙලාවට සම්බන්ධතා නැ ඉතින් ඒක මම යෝජනා කරනවා අපි මාස හයක් අවුරුද්දක් විතර කාලයක් අපි මේක අපි කරල බලමු දෙකෙන්ම එතකොට Email හාwattsapp වලට අපට වියදමක් යැවෙන්නැ ඒ වගේම මං ඉල්ලීමක් කරනවා සභාපතිතුමනි අපේ සිටින සියලුම මන්ත්‍රීවරු 36 දෙනාටම අපි එකම ඊමේල් එකක් හදල දෙමු ඒතකොට ඒ Email එක අපිට සභා වාර්තා එක අපට සභා වාර්තා ලබා ගැනීමට පාවිච්චි කරන්න පමණක් මොකද අපේ Phone එක ඊමේල් කිපයක් පවත්වා ගෙන යන්න පුළුවන් ඒතකොට අර පවත්වාගෙන යැමට පුළුවන් එතකොට ඊළඟට එන ගැටලුව තමයි Storge එක මදි වෙන එක Email එකක තියා ගන්න පුළුවන් දත්ත ගබඩා කරන්න පුළුවන් ප්‍රමාණයක් තියෙනවා මං හිතන්නේ නොමිලේ ලබා දෙන එක GB 5 ක විතර වගේ ප්‍රමාණයක් තියෙන්නේ එතකොට මේ ප්‍රමාණය මේ වගේ Document එන්න ගත්තාහම අඩුවෙලා යනවා ඒකට අපි ප්‍රායෝගිකව අපට මුදල් ගෙවලා පාවිච්චි කරනවා කියන එක ප්‍රායෝගික නැ ඉතින් අපි සියලු දෙනාට ම ගූගල් එකේ අපට අලුත් Email එකක් හදන්න පුළුවන් තාක්ෂණික නිලධාරීන් හරහා අපි කට්ටියත් එක්ක හදවගමු එතකොට ඇහැලියගොඩ ප්‍රාෙද්ශිය සභාවේ මන්ත්‍රිවරුන්ගේ නම දාල ඒ Email එකක් එතකොට ඒ Email එකට විතරයි මේක එන්නේ එතකොට තව එකක් අපිට සභාවේ Email එකක් හරි පාවිච්චි කරන්න පුළුවන් රිකවරි එකක් විදිහට එතකොටත් මම මේ ප්‍රාෙයා්ගික ගැටලු කියන්නේ මොකද සමහරවිට ඕන තරම් අපට තියෙනවා ඊමේල් අපට අමතක වෙච්චා අපිට ඒ ප්‍රශ්නය විසඳගන්න පුළුවන් ප්‍රයෝගික ගැටලුවක් මම කිවුවේ නැත්තන් Email එකක කියන්නේ දැන් ලෝකය පිළිගත්ත නීතිය ඉස්සරහ පිළිගත්ත wattsapp masege එකත් දැන් නීතිය ඉස්සරහ පිළිගන්නවා ඒ වගේ ම SMS එකත් නීතිය ඉස්සරහ පිළිගන්නවා නැත්නම් මේ Document එකේ අවශ්‍යතාව හින්ද නමුත් ප්‍රාෙයා්ගිකව අපි තවම දියුණු වෙමින් පවතින රටක මේ වගේ ප්‍රශ්න ඇතිවෙන්න පුළුවන් ඒ නිසා මං යෝජනා කරනවා ගරු සභාපතිතුමනි මාස හයක් හෝ අවුරුද්දක කාලයක් අපි මේක මේ දෙකෙන්ම Email හා wattsapp හා මේක පෝස්ට් එකෙන් එවන එක මොක ද අපේ මේ අයවැය තමා ගෙවල්වලට ගිහින් ලබා දීලා තියන්නේ අපි මේක ඒ හින්ද අපි post එකේ යවන්න ලියාපදිංචි තැපැලෙන් යවපුවහම ඒක ගැටලුවක් වෙන එකක් නැ කියල මං යෝජනා කරනවා සභාපතිතුමා.

**සභික ජී.එච්.එස්.එන්.කේ.විජේසූරියමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි ඔබතුමා කාලෝචිත හා ඉතාම වටිනා යෝජනා ටිකක් තමයි දාල තියෙන්නේ ඒක අපි අගේ කරනවා ඇත්තටම අපේ ගයාෂාන් මන්ත්‍රීතුමා කිවුව වගේ අපි 36 දෙනාම යම් යම් අවබෝධවල ඉන්න පුළුවන් ඊමේල් සම්බන්ධව වට්ස්ඇප් සම්බන්ධ කාරණා සම්බන්ධව IT ටෙක්නොලජි සම්බන්ධව යම් යම් අවබොධය අඩු වැඩි වශයෙන් තියෙනවා එතකොට අපිට මුදල ඉතුරු කර ගැනිමේ පරමාර්ථය නම් මෙතන තියෙන්නේ ඒකට මං එකඟ වෙන්නෙ නැ මොකද අපි සභාවක් විදියට මේ වසම් 44 ඉන්න මට හිතනවා අසුදාහකට ආසන්න ජනතාවගේ සේවකයෝ තමා මේ 36 දෙනා එතකොට අපි ඒ අවශ්‍ය අපි තීන්දුවක් ගත්තොත් ගෙදර අපේ දරුවන්ට දෙන වියදම එක පාරටම මේකෙන් භාගයක් අඩු කරන්න ඕන කියලා මට හිතෙනවා ඒක ප්‍රායොගික නැ ඔබතුමාගේ අදහස අපි අගේ කරනවා නමුත් මට හිතෙනවා මේ වගේ අවස්ථාවල දී අපි මේක සභාවක් විදිහට අපි ගයේෂාන් මන්ත්‍රීතුමා කිවුව වගේ ඊමේල් භාවිතා කරමු වට්ස්ඇප් භාවිතා කරමු අපි මං

කියන්නේ මං මේ කියන්නේ කාටවත් මේ අවබෝධයක් නැ කියන කතාව නෙමේ මං කියන්නේ මේ ප්‍රායොගික තත්ත්වය ගත්තාහම මේ physical Document එක එන්න ඔන මෙකෙන් තමා සියලු දෙනා ම මේ සම්බන්ධව අධ්‍යානය කරලා ඇති ඒක කියවන්න ඕන යම යම් කාරණා මත එක සාමාන්‍යයෙන් අපේ භාෂාවෙන් කිවුවොත් මේක ඇහට දැනෙන්න ඕන සභාපතිතුමනි මේ වාර්තාව ගියහම ඒක ගිහාම තමයි ඇගට එන්නේ ඒක නිසා ඒ යෝජනාව අපේ ගරු මන්ත්‍රිතුමා ස්ථිර කරා අපි ඒක මං හිතන්නේ සභාපතිතුමා එක දැනුවත් කරයි ඉදිරියේදී අපි එතකොට අපි මේ ගරු සභාපතිතුමනි මේකෙ Hard copy එක අපට එවන්න එක අපි යෝජනා අපේ යෝජනා සම්මත කර ගැනීම කතා කරල කරගන්න පුළුවන් එතකොට අපි ඉදිරියේ දී Email එකත් යවන්න wattsapp එකත් යවන්න ගයේෂන් මන්ත්‍රතුමා කිවුව වගේ අපි group එකක් අපි හදා ගමු ඒ කියන්නේ මේ Hard copy එක අපිට එවිය යුතුයි.මොකද අපි මේ වියදම අඩු කරන්න කියලා අපි ඊට වඩා දේවල් ඔබතුමාට ඔබතුමා අලුත්නේ අපි මේකෙ ඉදලා අපි දන්නවා මේකෙ ක්‍රියා කලාපය අඩු පාඩු අනවශ්‍ය වියදම් ටික කපා හරින වේලාවට අපි එකහ වෙනවා ඒක කිසිම ප්‍රශ්නයක් නැ ඔබතුමා කිවුවොත් ඉදිරියේදී අපිට ඒව අපි ඒවට එකඟ වෙනවා ප්‍රශ්නයක් නැ අපි සහයෝගය දෙනවා මේ වගේ දේවල් වලට අඩු කරන්න එපා ගරු සභාපතිතුමා මේක ඕනෙ මේ Hard copy එක ඔන මේක දැක්කහම තමයි අපට ඊ ගාව Re-action එක ගන්න පෙළඹෙන්නේ ඒක නිසා මං හිතන්නේ අපි ඒ නිසා මං හිතන්නේ අපි Hard copy එක දැනට එවන්න අපි වාහනය යවන්නේ ගයේෂාන් මන්ත්‍රාතුමා කිවුව වගේ අය වැය වාර්තාව විතරයි.මං හිතන්නේ ලේකම්තුමා දන්නවා ඒ නිසා තැපැලෙන් මේක එවන්නේ තැපැලෙ එවුවට පස්සෙ ,මං හිතන්නේ මේක ගැටලුවක් මතු වුණේ අපෙ විශේෂ මහා සභාවයි මහා සභාවයි අතර කාල ප්‍රමාණවත් නැති නිසා රාජකාරී නිවාඩු හතරක් තුළනේ එවන්න ඕනෙ ඒ හින්ද තමයි ඔබතුමා මේ තීන්දුව ගන්න ඇත්තේ අපි ඉදිරියේ දී දැන් අපි දන්නවනේ ඊ ගාව මාසේ දෙවැනි අඟහරුවාදා සභාව තියෙනවා කියලා ඒ හිනිදා අපි දැන් ලැස්තිවෙන්න ඕනේ.ඔබතුමා උපදෙස් දෙන්න නිලධාරීන්ට ලේකම් මහත්තයා ඒ වැඩේ කරයි ඒ නිසා මේ සම්බන්ධව අවධානය යොමු කරලා Hard copy එක අපට දැනට එවන්න ඒක ඔබතුමාට අවශ්‍ය විදිහට කටයුතු කරන්න.

**සභාපතිතුමා:-**

සියල්ලන්ට ම ස්තුතියි.
මීළඟට අංක හය යටතේ යෝජනාව හයවෙනි යෝජනාව

**සභාපතිතුමා:-**

**VI. සභාපති විසින් භාවිතා කරන නිල රථය වන SG-PF-6729 දරණ කැබ් රථයේ ඉන්ධන සීමාව ලෙස ලීටර් 800 ක් යෝජනා කරමි.**

**සභික දිලීන් කරුණාපාලමැතිතුමා:-**
සභාපතිතුමාගේ තීරණය ප්‍රකාශ කළොත් හොඳයි.

**සභාපතිතුමා:-**

ඇත්තටම නමුත් මේ වැඩේදී එක්කෙනෙක් හරි විරුද්ධ වුණොත් මේ වැඩේ කරන්න බෑ.ඒක හින්ද ඒක අපි යෝජනා කරල යෝජනා ස්ථිර කරාට මේක එහෙම ස්ථිර වෙන් නෑ.

**සභික ජී.එච්.එස්.එන්.කේ.විජේසූරියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි පුළුවන් තරම් අපි බෙදීම්වලට නොගිහින් අපි සාමදානව විසදගමු එතන්ට .ඔබතුමා මැදිහත් වෙන්න.

**සභාපතිතුමා:-**

අනිවාර්යෙන් ම

ඒ අනුව මහා සභා වාර්තා ඉදිරියට Email හා Wattsapp මඟින් ලබා දීමට සභාවට යෝජනාව අනුව මහා සභා වාර්තා මාස හයක් හෝ අවුරුද්දක් යන තෙක් Email , Wattsapp හා තැපැලෙන් ලබා දීමට සභාවේ ඒකමතිකව සභා සම්මත විය.(තීරණය විය. )

**සභාපතිතුමා:-**

මම නැවතත් කියන්නම්.

**VI. සභාපති විසින් භාවිතා කරන නිල රථය වන SG-PF-6729 කැබ් රථයේ ඉන්ධන සීමාව ලෙස ලීටර් 800 ක් යෝජනා කරමි.**

**සභාපතිතුමා:-**

මේක මං හිතන්නේ පරණ අපේ හිටපු මන්ත්‍රීවරු දන්නවා ඇති මේක වැඩි කිරීමක් නෙමේ.මේක අවුරුදු කීපයකට ඉස්සර ඉදන් තිබිල තියෙනවො මේ ඉන්ධන සීමාව කිසිම විටෙක මේක ඉක්මවල ගිහින් නෑ.

**උපසභාපතිතුමා මහේෂ් රත්නායක මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි ඔබ සභාපතිවරයා ලෙස ඔබතුමාට වසම් 44 ම කාර්යන් කළ යුතුයි.විශේෂයෙන්ම ඔබතුමා මේ වසම් 44ම සැම වසමකටම සැම රාජ්‍ය ආයතනයකටම පළාත් සභාවටව විවිධ අවශ්‍යතාවය අනුව යන්න සිදුවෙනවා.මං හිතෙනවා මේ ඉන්ධන ලීටර් සීමාව මේ ඇත්තටම කලින් සභාපතිවරු පාවිච්චි කරපු සීමාව අපි මාස කීපයක් ඒ වගේ අපේ ප්‍රතිපත්තිය තමා අනවශ්‍ය වියදම් අඩු කරන එක ඉතින් අපි මාස කීපයක් කටයුතු කරලා අපි බලමු.මේක කොහොමද තව අඩු කරන්න පුළුවන්ද කියල

**උපසභාපතිතුමා මහේෂ් රත්නායක මැතිතුමා:-**

අපි දැනට මේ ඉන්ධන සීමාව ලිටර් 800 ඔබතුමා ගෙනා ඒ යෝජනාව මං ස්ථිර කරනවා.

ඒ අනුව සභාපති විසින් භාවිතා කරන නිල රථය වන SG-PF-6729 කැබ් රථයේ ඉන්ධන සීමාව ලෙස ලීටර් 800 ක් සඳහා වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය

**සභාපතිතුමා:-**

ඒ වගේම සුජීව මන්ත්‍රීතුමා කියනවා සමහර යෝජනා ස්ථිර කරල ම කතා කරනවා කියලා.ස්ථිර කළාට අවසාන නිගමනය වෙන්නේ මන්ත්‍රීවරු ඒක සාකච්චා කරල ඒක ගැන වාද විවාද කරල පස්සේ සභාපති විසින් දෙනු ලබන තිරණය ස්ථිර කරල කතා කරාට ඒකෙ ගැටලුවක් ඇති වෙන්නෙත් නෑ.

**සභික ජී.එච්.එස්.එන්.කේ.විජේසූරියමැතිතුමා:-**

ගරු සභාපතිතුමා හරි මට ඒක තේරෙනවා මම අර කිවුවේ මෙතන වැඩිපුර මහජන නියෝජිතයින් ඉන්නේ නවක මන්ත්‍රීවරු සභිකයො සභාපතිතුමා මං ඒක දන්නවා.බොහොමත්ම ස්තුතියි.

**සභාපතිතුමා:-**

බොහොමත්ම ස්තුතියි.ඊළඟ යෝජනාව

**සභාපතිතුමා:-**

**VII. ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා ගොඩනැගිල්ලේ බිම් මහල හා පළමු මහල වැසිකිළි පද්ධති සම්පූර්ණ අලුත්වැඩියා කිරීම,බිම් මහලට ආවර්ණ ගේට්ටුවක් සැකසීම සඳහා ඇස්තමේන්තුගත වියදම රු.3480000.00 ක් වියදම් දැරීමට යෝජනා කරමි.**

**සභාපතිතුමා:-**

මෙය මේ අද ඊයෙ තියෙන එකක් නොවේ මේ ගැටලුව ඔයාල පොඩ්ඩක් මේ සියලුම මන්ත්‍රීවරු මේක ගැන පොඩ්ඩක් ගිහිල්ල බැලුවොත් අර පල්ලෙහා බිම්මහලේ ඇතුල් වෙන තැන උඩ බිල්ඩිම පවා දැන් දිරල යකඩ මතු වෙන්න අරන් තියෙන්නවා මේක මේ අවුරුදු හත අටක ඉදන් එන ප්‍රශ්නයක් මේ වෙළඳ ව්‍යාපාරිකයෝ ප්‍රාදේශිය සභාවට යොමු කරපු ප්‍රශ්නයක් කවුරුත් මේකට අතගහල නෑ මොකද මේ ටොයිලට්වල වතුර ලීක් එක හොයා ගන්න මෙතෙක් පුළුවන් කමක් වෙලා නෑ ඉතින් මේක අපි යෝජනා කරල තියෙන්නේ මං හිතෙන්නේ මේක තියෙද්දි වෙනත් විදියකින් මේ ටොයිලට් පද්ධතිය අලුත්වැඩියා කරන්න.

**උපසභාපතිතුමා මහේෂ් රත්නායක මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි ඇත්තටම අපිට පහළ කඩකාමර බදූ දිල තියෙන ඒ ව්‍යාපාර මහත්වරු අපිට නිරන්තරයෙන්ම අවුරුදු කීපයක ඉදන් අපෙ සභාව නැති කාළේ ඉදන් ම සභාවේ මහජන නියෝජිතයෝ නැති කාලෙ ඉදන්ම එ ගොල්ලො කරපු මැසිවිල්ලක් තමයි මේක ඒ ගොල්ලන්ට දෙන්න ඕන පහසුකම් ටිකත් හරියට සභාව විසින්න නිසි වගකිම් කරන් නෑ කියන එක මම හිතනවා මේක කාලෝචිත යෝජනාවක් කියලා.ඒ වගේම ඇස්තමේන්තුව සකස් කරල තියෙනවා අපි මේ ඇස්තමේන්තු මුදල බැලූ බැල්මට ටිකක් වැඩියි වගේ පේනවා අපි අත්‍යවශයෙන්ම බලලා ඒ කියන්නේ බිම්මහල හා පළමු මහලේ ඒ අත්‍යඅවශම ඒ වගේම

සම්පූර්ණ අලුත් වැඩියාවක් කරන්න ඕන අලුත් වැඩියාවට කරාට පසු නිසි විදියට ඒක පිරිසිදු කිරීම කරන්නත් ඕන මේ අපි හිතනවා නැත්තන් වෙන්නේ අපි මේ දරණ වියදම එලදායි වෙන්නැ.ඒක හරියට පිරිසිදු කරලා සුද්ද පවිත්‍ර කරලා ඒක නිසි විදියට පවත්වාගෙ යා යුතුයි මුදල කියන්නේ වියදම් කරල කරන දේ අපි ආරක්ෂා කර ගැනීමට නිසි වැඩපිළිවෙලක් සකස් කරමු.

**උපසභාපතිතුමා මහේෂ් රත්නායක මැතිතුමා:-**

මම මේ යෝජනාව ස්ථිර කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**

සභාපතිතුමනි ඒ කාලෝචිත යෝජනාවට මම දිගුවක් ගේන්න මම බලාපොරොත්තු වෙනවා ඇත්තටම පොල භූමියේ වැසිකිලි පද්ධතියත් නඩත්තු තළ යුතු මට්ටමක පවතිනවා සුසාන භූමියේ තියෙන වැසිකිලි පද්ධතියත් මැණික් පොල අසල තියෙන ප්‍රධාන වැසිකිළි පද්ධතියත් මෝරගල ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගනයේ තිබෙන වැසිකිලි පද්ධතියත් ගැටහැත්ත පොල භූමියේ තිබෙන වැසිකිලි පද්ධතියත් දම්මුල්ල පොල හා බහුකාර්ය ගොඩනැගිල්ලේ වැසිකිළි පද්ධතියත් මේ සමඟ ම දිගුවක් ලෙස ගොනු කරලා ඒකට ත් යම් ප්‍රතිපාදනයක් වෙන් කරලා මේ මොහොතෙම යම් ප්‍රෙවිශයක් ගන්න කියලා මං යෝජනා කරනවා යෝජනා කරනවා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි මේ වැසිකිලි පද්ධති වල බොහොමයකට ප්‍රශ්න වෙලා තියෙන්නේ නඩත්තුවේ දී හා භාවිතයේදී වන ගැටලු ගරු සභාපතිතුමන් ගෙන් මං ඉල්ලා සිටිනවා නව අලුත් වැසිකියේදී මේවාට අපි කාන්ති හා පිරිමි විදිහට වෙන් කළා නම් කොමඩ් එක කොමඩ් එක ස්වංක්රීය නෑ ඔබන්න ම ඔන හැබැයි ඒකට ස්වංක්රිය පද්ධතියක් ගෙනැත් සවි කරන්න පුළුවන් නම් ඊට අමතරව හැබැයි ඒක මිල අධික වෙන්න පුළුවන් පිරිමි අය දන්නවා අපි බාත් රූම් එකට ගියහම අපට වෙනම යූනිවල් එකක් තියෙනවා භාවිතා කරන්නේ බිත්තියේ සවි කරල තියෙන ස්වංක්රියව වතුර ප්ලස් වෙලා යන එකක් ඒ මට්ටමේ එකක් අපට මිලදී ගන්න පුළුවන් ලොකු විශාල මිල පරාසයක් වෙන් නෑ සුළු වැඩි වීමක් තමයි වෙන්නේ එතකොට මේක පිරිසිදුව හැමදාම පිරිසිදුව තබා ගන්න පුළුවන් එතකොට මේක භාවිතය වැඩි වෙනවා භාවිතය වැඩි වෙනවා එතකොට යම්කිසි අලාබයක් වෙලා තියෙනව නම් ඒකට එන ඉල්ලීම් ප්‍රමාණය වැඩි වෙනවා දැන අපි දන්නවා මේකට මැණික් පොල අසල තියෙන එක භාවිතා නොවීම තමයි ප්රධාන ම ගැටළුව වෙන්නේ දැන් පොලේ තියෙන එක භාවිතා නොවීම මිනිස්සු යන් නැති වුණා ම තමයි ඒක රෙපෙයාර්වෙ වෙන් නැත්තේ හැබැයි අපි අර පිරිසිදුව කොළඹ තියෙන පොදු වැසිකිලිවලට ඕනැම කෙනෙකුට යන්න පුළුවන් ඕනම තරාතිරමක කෙනෙක්ට යන්න පුළුවන්. මොකද ඒක හොඳ පිරිසිදු මට්ටමේ තියෙනවා හැබැයි අපි ගමක තියෙන එකකට යන්න ගියහම අපට ඒකකට යන්න බෑ.අපි සියලු දෙනා ම මං හිතන් නෑ මෙතන ඉන්න 36 දෙනාගෙන් කිසිම කෙනෙක් මේ ඇහැලියගොඩ තියෙන පොදු වැසිකිලියට ගිහිල්ල නැතුව ඇති හේතු ව තමා මේක අපිරිසිදුකම ඉතින් ගරු සභාපතිතුමාගෙන් මං ඉල්ලා සිටිනවා අපි විශාල මුදලක් යොදවල මේ කරන අලුත් වැඩියාවෙන් පසු මේක නඩත්තුව සඳහා යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්න ඕන ඒ කියන්නේ යම්කිසි නිලධාරියෙක් සේවක මහත්මයෙක් ගන්න වෙනවා මේක දිනපතා මේක පිරිසිදු කරලා තියා ගන්න විදිහට ඉතින් මං ඉල්ලා සිටිනවා ස්වංක්රීය පද්ධතියකට යන්න පුළුවන් නම් ඒක බොහොම හොඳයි දැනට ජපානයේ එහෙම නම් තියෙනවා බිමත් ඒ කියනනේ වතුර කොහෙවත් හයිපෙෂර් වතුර එකක් අල්ලනවා පාවිච්චි කරල ආවට පස්සේ කොමඩ් එකට තියෙන සීට් කවරේ පවා මාරු වෙනවා ඊට පස්සේ පොළව හේදිලා යනවා ඉතින් අපිටඒ තත්ත්වය ගන්න බෑ.හැබැයි අපට අර යූනිවල් එක ස්වංක්රීයව වතුර ප්ලස් වෙලා යන එකක් සවි කරන්න පුළුවන් ඒ වගේම මංවිශේෂයෙන් ම කරන ඉල්ලීම තමා මේ අලුත් වැඩියාවෙන් පස්සේ අපට සේවක මහත්මයෙක් යොදවල පිරිසිදු කිරිම සඳහා පොඩි යෝජනාවක් බලන්න.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි ඇත්තටම මේ අපේ සභාවේ තියෙන අනිවාර්යෙන් ම සංවර්ධනය විය යුතුමයි.

අනෙක් එක තමයි මේ දකින දෙයක් තමයි මේ ඇහැලියගොඩට අවිධිමත් සැලැස්මක් තියෙන්නේ විධිමත් සැලසුමකට කිසිම දෙයක් කරලා නෑ.දැන් මෙතන ඉස්සරහ තියෙන මාළු කඩේ ප්‍රාදේශීය සභාවේ මාළු කඩේ මාළු කඩේ එතන දාන්න බෑ.ඒක කවුද නිර්දේශ කරල තියෙන්නේ ඒ වතුර ටික ඒ ජරාව ටික එතන දාන්න බෑ වැඩේ එවා වැඩි දියුණු කරල මේකට අනිවාර්යෙන්ම ඒ වතුර ටික මේ හරහා යනවා පොල තැන පොල ඔතන හරියන් නෑ ඔතන තිබ්බෙ ground එකක් ඉතින් ඒක අයින් කරලා ඒකට පොලක් සම්බන්ධ කරලා තිබුණහ ම ඒක සාර්ථක නෑ ඉතින් මේ හැම එකක් එක්කම කතා කරන්න ගියෙපුවහම තියෙන්නේ අවිධිමත්ම දේවල් තමයි තියෙන්නේ දැන් මැණික් පොල ළඟ එහා පැත්තෙන් වැසිකිලිය කවුරුවත් යන්නෙ නෑ ඒකට එතකොට මෙහා පැත්තෙ මැණික් පොලේ වෙනම ඇතුළෙන් එකක් හදල තියෙනවා.ඉතින් ඒවා ප්‍රාදේශීය සභාවෙන් නඩත්තු වෙන් නෑ මං හිතන්නේ ඉතින් ඒ පිළිබඳව වෙනම කතිකාවතක් අපි මේ මේකෙ ප්‍රාදේශිය සභාවේ එක නම් අනිවාර්යෙන්ම ඒක සංවර්ධනය විය යුතුයි. මොකද අර පල්ලෙහා මම දැක්කා මීට කලින් ඇවිදිල්ලත් බලලා තියෙනවා කුණු වලක් තියෙනවා ඒක මුල්ලේමේකෙම යට තනි කුණු වලක් තියෙන්නේ ඒකෙ පණුවොත් ඉන්නවා වැඩේ අපි දැකල තියෙනවා ඉතින් ඒක හරිම අශෝභනයි ඒක දිහා දකින්න අපි අකමැතියි

ඉතින් ඒක නිසා වහාම ඒක මුදල නෙමේ ප්‍රශ්නෙ වැදගත්ම ප්‍රධාන ආයතනයක් මේ ප්‍රධාන ආයතනය හරි පිරිසිදුව ලස්සනට තියෙන්න ඕන ජපානෙ වගේ වෙන්න බැරි වෙයි හැබැයි හොඳ මට්ටමේ තියෙන්න ඕන එක මම ඉල්ලිමක් කරනවා අර කාණු පද්ධතියත් හැබැයි ඒකත් සංවර්ධනය විය යුතුමයි.

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්නමැතිණිය:-**

ගරු සභාපතිතුමනි එතන දි මේ වැසිකිලි පද්ධතිය සම්බන්ධයෙන් ඒ යෝජනාව ගොඩක් හොඳයි.ඒ වගේම මගේ යෝජනාවක් තියෙනවා ඇත්තටම ඇහැලියගොඩ නගරයේ අර මන්ත්‍රීතුමා කිවුව වගේ හරියට සැලැස්මක් නෑ කියනව වගේම උඩහට වැසිකිලියක් තිබුණත් මේ වනවිට පල්ලෙහා හන්දියට වැසිකිලියක් නෑ.ඒ නගරයේ කෙනෙකුට යන්න යන්න විදිහක් නෑ.මගේ පියා ඉන්නකොට මේක ලොකු විශාල උපසභාපතිතුමා සාක්ෂි දරනවා ලොකු විශාල අර්බුදයකට ලක් වෙලා මං ඒ යෝජනාවත් කරනවා පල්ලෙහා හන්දියට බෝගහ හරිය ප්‍රදේශයටත් වැසිකිලි පද්ධතියක් ලබා දෙන ලෙස.

**සභාපතිතුමා:-**
බොහොමත්ම ස්තුතියි.

**සභාපතිතුමා:-**
මේකෙ මුදල එක පාරටම කිවුවට වැට් සහ පරිපාලන වියදමත් එක්ක තමයි හදල තියෙන ඒක නිසා අනික තමයි වැසිකිලි පද්ධතිය ගත්තහම අපට අලුතින් තියන්න ඔන නෑ.ඒක හින්ද මන්ත්‍රිවරු ඇවිල්ල ඉන්නවා මන්ත්‍රිවරු මේ සඳහා යෝජනා add කරන්න සුජීව මන්ත්‍රිතුමත් දන්නවා අපිට ඕක ඔන වැසිකිලි පද්ධතියක් තියෙන එකේවත් සමහර ඒවා අපිට නවීකරණය කරන්න බෑ අපි ගත්තොත් අතන මැණික් පොල ළග තියෙන්නෙත් ප්‍රාදේශීය සභාවට අයත් වැසිකිලියක් නෙවේ ඒක රේල්ලුවේ ඒකක් අපිට අයිති නෑ ඒ වගේ ලොකු ගැටළු ටිකක් තියෙනවා ඉස්සරහ දී ඔය ගොල්ලන්ට මේ සඳහා යෝජනා ඉදිරිපත් කරන කොට මන්ත්‍රීවරුන්ට අයිතියක් තියෙනවා ඊළහ සභාවේ දී අපට ඒ සුදුසු යෝජනා ඉදිරිපත් කරන්න ඒ සඳහා සභාවත් එක්ක කතිකාවත් කර ගන්න පුළුවන්.

ඒ අනුව ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා ගොඩනැගිල්ලේ බිම් මහල හා පළමු මහල වැසිකිළි පද්ධති සම්පූර්ණ අලුත්වැඩියා කිරීම,බිම් මහලට ආවර්ණ ගේට්ටුවක් සැකසීම සඳහා ඇස්තමේන්තුගත වියදම රු.3,480,000.00 ක් වියදම් දැරීම යෝජනාව ඒකතිකව සභා සම්මත විය

**සභාපතිතුමා :-**
මීළඟ යෝජනාව

**VIII. ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ ප්‍රධාන ගොඩනැගිල්ලේ පිටුපස බිම් කොටස වෙන් කර ගැනීම සඳහා මායිම් බැම්මක් හා ගේට්ටුවක් ඉදිකර වෙන් කර ගැනීම සඳහා ඇස්තමේන්තුගත වියදම රු.1037300.00 ක් වියදම් දැරීමට යෝජනා කරමි.**

**සභිකජී.එච්.එස්.එන්.කේ.විජේසූරිය මැතිතුමා :-**
ගරුසභාපතිතුමනි මේ සම්බන්ධව යම් ක්‍රියා මාර්ගයක් ගැනීමට පෙර මම ඔබතුමාගෙන් දැන ගන්න කැමතියි මේ සම්බන්ධව මහා සභාව කාරක සභාවක් බවට පත් කරලා ලේකම්තුමාගෙන් ඒ සම්බන්ධව කරුණු ටිකක් දැන ගන්න අවශ්‍ය වෙනවා මට ඒ සඳහා අවස්ථාව ලබා දෙන්න.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි මහා සභාව කාරක සභාවක් බවට මම යෝජනා කරනවා.

**සභික දිලීන් කරුණාරත්න මැතිතුමා :-**
එය මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි කාරක සභාව මහා සභාවක් බවට මම යෝජනා කරනවා.

**සභික ජී.එච්.එස්.එන්.කේ.විජේසූරියමැතිතුමා:-**
එය මං ස්ථිර කරනවා.

**සභික ජී.එච්.එස්.එන්.කේ.විජේසූරියමැතිතුමා :-**
මං හිතන්නේ අපි ලේකම් තුමා මගින් ඒ සම්බන්ධව පුළුල් අවබෝධයක් ලබා ගත්තා මං හිතනවා මේ සම්බන්ධව ඔබතුමාටත් ලිඛිතව දැනුවත් කරල තියෙනවා.මෙතන ඉන්නේ මං හිතන්නේ මෙතන ඉන්න

මන්ත්‍රීවරුන්ගෙන් වැඩි ප්‍රමාණයක් ඇහැලියගොඩ ජාතික පාසලේ ආදි ශිෂ්‍යයෝ නේ ඒක හින්ද මේක අපි ගැටුමකට නොයා මේ අද අපි ගෙනා යොජනාව අපි ඊළඟ සභාවකට කල් තියලා අපේ Enco එකේ අපේ සාමාජිකයෝ සම්බන්ධ කර ගෙන ඒ සම්බන්ධව සාකච්ඡාවක් තියලා අපි ඒ ගැන තීන්දුවක් ගමු කියලා මම ඔබතුමාට අදහසක් විදිහට ඉදිරිපත් කරනවා.

**සභාපතිතුමා :-**
ඇත්තටම අපි මෙතනදී මේ ඇහැලියගොඩ මහා විද්‍යාලය සහ සභාව නගරෙ ප්‍රාදේශිය සභාව කියන්නේ අපේ හදවත වගේ තැනක් නමුත් මනත්‍රීවරුනි අපිට තියෙනවා අයිහාරවලට යොමු වෙනවා අපිට අර එතන ස්ථිර කියන්නේ ඒගොල්ලන්ට හිතුමතේ ස්ථිර කරන්න දෙන්න අමාරුයි.ඒකහින්ද මේ අපි ඒගොල්ලෝත් කැඳවලා අපේ පාර්ශවයත් කැඳවල සක්‍යාතා අධ්‍යානයක් කරලා හරියටම plan එකක් අරගෙන ආණ්ඩුකාරතුමියටත් කොමසාරිස්තුමාටත් දන්වල අපි ඒ වැඩේ කරමු.එහෙම නැතුව අපිට එක පාර ඒගොල්ලො අපේ සභාවෙන් plan එක අනුමත කර ගන්න එපැයි. එහෙම මොකවත් කරලනෑ.ඒක හින්ද අපි ඒ විදිහට යොමු කරමු අපි මේ යෝජනාව තාවකාලිකව

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා :-**
ඒ සාකච්ඡාවට අපිවත් දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**සභාපතිතුමා :-**
අනිවාර්යෙන්ම

**සභික ජී.එච්.එස්.එන්.කේ.විජේසූරියමැතිතුමා :-**
ගරු සභාපතිතුමනි අපේ දෙවැනි අඟහරුවාදානේ සභාව තියෙන්නේ ඊට කලින් බැරි වෙයි ඔබතුමා ඒක සැලසුම් කරලා ලේකම්තුමා එක්ක සාකච්ඡා කරලා වැඩපිලිවෙලක් හදාගන්න.

**සභික වජිර සුසන්ත ජයසෝම මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි නගර සැලසුමක් එක්ක මේක බලන්න වෙනවා.

ඒ අනුව ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ ප්‍රධාන ගොඩනැගිල්ලේ පිටුපස බිම් කොටස වෙන් කර ගැනීම සඳහා මායිම් බැම්මක් හා ගේට්ටුවක් ඉදිකර වෙන් කර ගැනීම සඳහා ඇස්තමේන්තුගත වියදම රු.1,037,300.00 ක් වියදම් දැරීම යෝජනාවට ආදි ශිෂ්‍ය සංගමය හා සාකච්ඡාවක් ගෙන කරුණු පහදා ගැනීමෙන් පසු ඉදිරි සභාවකට යොමු කිරීමකට තීරණය විය

**සභාපතිතුමා :-**
අනිවාර්යෙන්ම බොහොම ස්තුතියි ඊ ළඟ යෝජනාව

IX.ගැටහැත්ත බහු කාර්ය ගොඩනැගිල්ල (කඩ කාමර 10 හැර )වසර 05 ක් සඳහා බදු ලබා දීම වෙනුවෙන් වැඩිම මාසික ලංසු මුදල වූ රු.105000.00 ක මුදල ඉදිරිපත් කළ අංක 248 බී/1,ඇපිලියගොඩ ගැටහැත්ත ලිපිනයේ පදිංචි එම්.එන්.චන්ද්‍ර කුමාර මහතා හට 2025 ජුලි මස 01 දින සිට වෛද්‍ය උපකරණ තිබෙන A හා D හැර ඉතිරි B,C හා E කොටස් ව්‍යාපාර කටයුතු කර ගෙන යාමට අමුණුමේ සඳහන් ගිවිසුම් ප්‍රකාරව ලබා දීමට මම යෝජනා මම කරමි

**සභික ජී.එච්.එස්.එන්.කේ.විජේසූරියමැතිතුමා :-**
ගරු සභාපතිතුමනි මේ සම්බන්ධව කතා කිරීමේ දි මං හිතන්න අප්‍රේල් මාසෙ වගේ ඊට ප්‍රථම දිනමිණ පත්තරේ මේ සම්බන්ධව දැන්වීමක් පළ කරනවා ඒ සම්බන්ධව මං කැමතියි ඔබතුමාට මේ මහා සභාව කාරක සභාවක් බවට පත් කරලා ලේකම්තුමාගෙන් ඒ සම්බන්ධව තොරතුරු දැන ගැනීම සඳහා

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි මහා සභාව කාරක සභාවක් බවට මම යෝජනා කරනවා.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා :-**
එ යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ටී.ඩී. වජිර සුසන්ත ජයසෝම මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි මෙතැන් සිට කාරක සභාව මහා සභාවක් ලෙස යෝජනා කරනවා.

**සභික ජී.එච්.එස්.එන්.කේ.විජේසූරිය මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි ඒ යෝජනාව මං ස්ථිර කරමි.

**සභික ජී.එච්.එස්.එන්.කේ.විජේසූරියමැතිතුමා :-**
අදහසක් ප්‍රකාශ කරන්න කැමතියි. අපි මේ සම්බන්ධව කාරක සභාවක් තියලා අපි ලේකම්තුමාගෙන් උපදෙස් ගත්තා. ඒ නිසා අපට මේක ආපස්සට හරවන්න බෑ. අපි මේක ආපස්සට හැරෙව්වොත් අපි සියලු දෙනාම අධිභාරයට ලක් වෙනවා. ඒ නිසා මේ ගත්තු දින තීන්දු අනුව ඔබතුමා ක්‍රියාත්මක වෙන්න. එතකොට පළවෙනිද දෙන්න ඕන්නම් එයාට අද ඉඳන්ම ලේකම්තුමාට උපදෙස් දෙන්න ගරු සභාපතිතුමා මේක ඉක්මන් කරල කරන්න කියලා ඒ කරන කොට හෙට අනිද්දම අපේ මන්ත්‍රීවරු සම්බන්ධ කරගෙන ඉතාමත් ඉක්මනින් ඒ කොන්දේසි ටිකත් අර ගෙන මේ ගිවිසුමට ඇතුළත් කරලා එය පළවෙනිද ඉඳන් ක්‍රියාත්මක කරන්න ඔබතුමා වැඩපිළිවෙලක් හදන්න අපි අපේ සහයෝගය ලබා දෙනවා මං හිතන්නේ ඊට වඩා ඔබතුමාට අපෙන් අවශ්‍ය දෙයක් තියෙනව නම් කියන්න.

**සභාපතිතුමා :-**
මට හිතෙනවා අපි මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස් කරමු ද?

**සභික ජී.එච්.එස්.එන්.කේ.විජේසූරියමැතිතුමා :-**
රැස් කරමු.

ඒ අනුව ගැටහැත්ත බහු කාර්ය ගොඩනැගිල්ල (කඩ කාමර 10 හැර ) වසර 05 ක් සඳහා බදු ලබා දීම වෙනුවෙන් වැඩිම මාසික ලංසු මුදල වූ රු.105,000.00 ක මුදල ඉදිරිපත් කළ අංක 248 බී/1,ඇහැලියගොඩ ගැටහැත්ත ලිපිනයේ පදිංචි එම්.එන්.චන්ද්‍ර කුමාර මහතා හට 2025 ජූලි මස 01 දින සිට වෛද්‍ය උපකරණ තිබෙන A හා D හැර ඉතිරි B,C හා E කොටස් ව්‍යාපාර කටයුතු කර ගෙන යාමට අමුණුමේ සඳහන් ගිවිසුම් ප්‍රකාරව ලබා දී ම වූ යෝජනාව සඳහා කඩිනමින් මුදල් කමිටුවක් රැස් කර ඊට අදාළ කොන්දේසි හා තීරණ ගෙන ගිවිසුමට ඇතුළත් කර ඉදිරි කටයුතු කිරීමට ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
බොහොමත්ම ස්තුතියි.
අපි ඉස්සරහට යමු නේද

**සභාපතිතුමා :-**
XI.ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත් පදනම මත සේවය කරන පහත උපලේඛනයේ සඳහන් සේවක මහත්ම මහත්මීන්ගේ 2025.07.01 වන දිනසිට මාස 06 ක කාලයක් සඳහා නව ගිවිසුම් ඇති කර ගැනීමට හා ඔවුන් වෙත වැටුප් ගෙවීමට යෝජනා කරමි.

උපලේඛනය

| අනු අකංය | නම | තනතුර |
|---|---|---|
| 1. | එච්.චන්ද්‍රාවතී මිය | සෞඛ්‍ය කම්කරු |
| 2. | කේ.බී.සන්ධ්‍යා කුමාරි මිය | සෞඛ්‍ය කම්කරු |
| 3. | එච්.රාජා මයා | සෞඛ්‍ය කම්කරු |
| 4. | ජේ.ක්‍රිෂාන්ති කුමාරි මිය | සෞඛ්‍ය කම්කරු |
| 5. | පී.කුමාර මයා | සෞඛ්‍ය කම්කරු |
| 6. | එච්.ඒ.විජයලතා මිය | සෞඛ්‍ය කම්කරු |
| 7. | එම්.පී.ජීවරානි මිය | සෞඛ්‍ය කම්කරු |
| 8. | ඩබ්.එච්.ඩී.සරත් ගාමිනී රණසිංහ මයා | සෞඛ්‍ය කම්කරු |
| 9. | එස්.ඊ.රාණි මිය | සෞඛ්‍ය කම්කරු |
| 10. | කේ.ඒ.ඩී.වසන්ත මයා | මුරකරු |
| 11. | ඩී.එම්.සුනිල් මයා | මුරකරු |
| 12. | ඩබ්.ඒ.විජේරත්න මයා | මුරකරු |
| 13. | අසිත ඔවින්ද විජේසිංහ මයා | රියදුරු |
| 14. | ජී.ආර්.සමීර මධුශාන් ගමලත් මයා | රියදුරු |

**සභාපතිතුමා :-**
මං කියවන ලද ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ කොන්ත්‍රාත් පදනම මත සේවය කරන පහත උපලේඛනයේ සඳහන් කරන මං කියවන ලද සේවක මහත්ම මහත්මීන්ගේ 2025-07-01 දින සිට මාස හයක කාලයක් සඳහා නව ගිවිසුම් ඇති කර ගැනිමට හා ඔවුන් වෙත වැටුප් ගෙවීමට යෝජනා කරමි.මේ තාවකාලික පදනම මත බඳවා ගත් සේවක සේවිකාවන්

**සභිකඑච්.ආරියදාසමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි මම ඒ යෝජනාව ස්ථිර කරනවා

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි විලේගොඩ සුසානාගාරයට තාවකාලික හරි කම්කරුවෙක් යොදවන්න හරි පුළුවන්නම් ඒකට අවස්ථාව දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**සභාපතිතුමා :-**
ඔව් ඇත්තටම ඒක මේ කට්ටියගෙන් කරන්න අමාරුයි අපි ඒකට දැනට එතන ඉන්න අය වෙන තැන්වලට වෙන තැන්වල ඉන්න අය දැනට තාවකාලිකව යොමු කරනවා.ඒ අවස්ථාව සඳහා.අපි ඊට පස්සෙ ඔබතුමන්ලා යෝජනා කරන්න ඊළඟ සභා වාර සඳහා අපි ඉදිරියට කරගෙන යමු.

**සභික ජී.එච්.එන්.අජන්ත විජයසිංහමැතිතුමා:-**
ගරු සභාපතිතුමා මම දැන ගන්න කැමතියි අර පොල භූමියේ කම්කරු මම හිතන්නේ ටිකට් කඩන කාන්තාවක් ඉන්නවා එතුමිය මං හිතන්නේ රාජකාරිය මොකද්ද කියන දේ පැහැදිලි නෑ පොල භූමියේ රඳවන බයික් පහකට තමා ටිකට් කඩන්න තියෙන්නේ ඉතින් එයා හවස් වෙනකම් ම එතන ඉන්නවා එයාගේ රාජකාරිය මොකද්ද එයාගේ තත්ත්වය මොකද්ද කියලා දැන ගන්න පැහැදිලි කරන්න

**සභාපතිතුමා :-**
ඒක මේ මන්ත්‍රිතුමා එතන මෙහෙම එකක් තමයි තියෙන්නේ සවලා කියන සෞඛ්‍ය කම්කරු කෙනෙක් තමයි ඒ වැඩේට දාල තියෙන්නේ ඇත්තටම Parking විතරක් නෙමෙයි බේරුවාන කසල අංගනයේ කසල වලින් අපි ඒක මේවා කරලා කරන ලද කොම්පෝස්ට් පොහොර අලවි කරන්නත් ඒ සේවිකාව යොදවල තියෙනවා ඊට අමතරව වැසිකිලි පද්ධතියේ යම් මුදලක් අය කරනවා ඒ සඳහාත් යොමු කරනවා.ඒ වගේ කාර්ය තුනක් සඳහා දැනට අපි අනුයුක්ත කරල තියෙනවා ඒ සේවිකාව

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි සුසානාගාරයට මේ කාඩර් එකේ කෙනෙක් යොමු කරන්න පුළුවන්කමක් තියේද?

**සභාපතිතුමා :-**
එහෙම කාඩර් එකේ එහෙම දැනට එහෙම තනතුරු නෑ.

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**
දැන් යොමු කළ නම් ටික මොකක් ද?

**සභාපතිතුමා :-**
ඇත්තටම මේ දැනට යොමු කරල තියෙනේ සභාවේ සෞඛ්‍ය කම්කරුවන් හා රියදුරු මුරකරුවන් තමයි සිටින්නේ.ඇත්තටම මෙතන ලොකු ප්‍රශ්නයක් තියෙනවා අපි මේ ලොකු වෙහෙසක් දරනවා සමහරවිට උප සභාපතිතුමා දන්නවා ඇති අපි රෑ දහය එකොළහටත් සමහර විට call කරලා කියනවා මේ කසල ප්‍රශ්නයත් එක්ක ඒකෙ ලොකු ගැටලු තත්ත්වයක් තියෙනවා සේවකයෝ ටිකක් ඉස්සරහ දි තාවකාලික පදනම මත හරි ගන්න සිදු වෙනවා

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්නමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි අතුරලිය මන්ත්‍රිතුමා අපේ මේ ආදාහනාගාරයට සේවකයෝ කීදෙනෙක් අනුමත වෙලා තියෙනවද ඒකෙ අඩුපාඩුවක් තියෙනව ද කියල තමා දැනගන්න උත්සහ කරන්නේ

**සභාපතිතුමා :-**
මන්ත්‍රීතුමා ඒක ඒහෙම අනුමත වෙලා නෑ මෙච්චරක් ඕන කියලා නිශ්චිතව සංඛ්‍යාවක් දාල නෑ දැනට අපි ඒ අවශ්‍යතාවය මත තමයි අපි දෙන්නෙක් ස්ථිරව ඉන්නවා ඊට අමතරව වැඩි ප්‍රමාණයක් අවශ්‍ය වෙන කොට අපි

වෙන තැන්වලින් අනුයුක්ත කරල වැඩ ටික කරගෙන යනවා එතන අයත් අපට ඉල්ලීම් කරනවා නමුත් අපට දැනටඑහෙම කම්කරුවන් අනුයුක්ත කරන්න බෑ ස්ථිර වශයෙන් තාවකාලිකව ඒ අවස්ථාවට උචිතව විදිහට ඒ කාර්ය කිරිමක් තමා නිශ්චිත මේ ගානක් කියලා අනුමත වෙලා නෑ

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්නමැතිතුමා:-**
සභාපතිතුමනි ඊළඟට අපි කාඩර් එක අනුමත කරනකොට අපේ අවශ්‍යතාවන් අනුව සලකල බලලා සේවා අවශ්‍යතාවයන් සොයල බලලා ඒවාට අවශ්‍ය විදිහට අපි හදමු

**සභාපතිතුමා :-**
අපි ඒක යවල තියෙන්නේ අපට ඒකට තවම ප්‍රතිඋත්තර ලැබිල නෑ

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්නමැතිතුමා:-**
බොහොමත්ම ස්තුතියි

**සභාපතිතුමා :-**
එහෙනම් අපි ඉස්සරහට යමුද එහෙනම් අපි ඒ යෝජනාව ස්ථිර කරමුද

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි මම ඒ XI යොජනාව ස්ථිර කරනවා

ඒ අනුව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත් පදනම මත සේවය කරන පහත උපලේඛනයේ සඳහන් සේවක මහත්ම මහත්මීන්ගේ 2025.07.01 වන දින සිට මාස 06 ක කාලයක් සඳහා නව ගිවිසුම් ඇති කර ගැනීමට හා ඔවුන් වෙත වැටුප් ගෙවීමට ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**

**XII.ප්‍රාදේශීය සභා පනතේ 216 වගන්තිය යටතේ අධිකාරය පිරිනැමීම යෝජනාව**

**1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 132 වගන්තිය යටතේ හෝ වෙනත් යම් ලිඛිත නිතියක් යටතේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ අරමුදලින් කළහැකි වියදමකට අදාළව වියදම රු.25000.00 නොයික්මවන ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙන් වන විට දී හා අදාළ වියදම් රු25000.00 නොයික්මවන පුනරාවර්තන වියදමක් වන විටදී වියදමට අදාළව බලයදීම සඳහා .ඇහැලියගොඩ. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ පොදු පරිපාලනයට යටත්ව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 216 වන වගන්තිය යටතේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙත අධිකාරය පැවරිය යුතු බවටත්, තවද එකී අධිකාරය මෙම යෝජනාවට අදාළ සභාවේ සම්මුතිය මෙම ප්‍රාදේශීය සභාව විසින් පරිච්චින්න කරන තාක් වලංගු විය යුතු බවටත් සභාවට යෝජනා කරමි.**

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි මම ඒ යොජනාව ස්ථිර කරනවා

අනුව ප්‍රාදේශීය සභා පනතේ 216 වගන්තිය යටතේ අධිකාරය පිරිනැමීම යෝජනාව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 132 වගන්තිය යටතේ හෝ වෙනත් යම් ලිඛිත නිතියක් යටතේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ අරමුදලින් කළහැකි වියදමකට අදාළව වියදම රු.25000.00 නොයික්මවන ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙන් වන විට දී හා අදාළ වියදම් රු25000.00 නොයික්මවන පුනරාවර්තන වියදමක් වන විටදී වියදමට අදාළව බලයදීම සඳහා .ඇහැලියගොඩ. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ පොදු පරිපාලනයට යටත්ව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 216 වන වගන්තිය යටතේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙත අධිකාරය පැවරිය යුතු බවටත්, තවද එකී අධිකාරය මෙම යෝජනාවට අදාළ සභාවේ සම්මුතිය මෙම ප්‍රාදේශීය සභාව විසින් පරිච්චින්න කරන තාක් වලංගු විය යුතු බවටත් සභාවට යෝජනා වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
අපි එහෙනම් ඉස්සරහට යමු

**සභාපතිතුමා :-**

**XIII.1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තිය යටතේ කාරක සභා වෙත බලය පැවරී යෝජනාව:-**

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 වන වගන්තිය සමඟ කියවිය යුතු 132 වගන්තිය යටතේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අතරින් මෙහි පහත උපලේඛනයේ විස්තර කරනු ලබන බලතල එම පනතේ 12 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව මෙම ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව වෙත පවරා දිය යුතුය යන්න යෝජනා කරමි.**

ඉහත කී උපලේඛනය

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ අරමුදලින් කළහැකි වියදමකට අදාළව වියදම රුපියල් මිලියන එකක් (රු.1,000,000.00) නොයික්මවන ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙන් වන විටදී හා අදාළ වියදම් රුපියල් මිලියන එකක් (රු.1,000,000.00) නොයික්මවන පුනරාවර්තන වියදමක් වන විටදී වියදමට අදාළමූල්‍ය වටිනාකමක් වෙනුවෙන් ගෙවීම අනුමත කිරීම.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි මම ඒ යොජනාව ස්ථිර කරනවා

ඒ අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තිය යටතේ කාරක සභා වෙත බලය පැවරී යෝජනාව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 වන වගන්තිය සමඟ කියවිය යුතු 132 වගන්තිය යටතේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අතරින් මෙහි පහත උපලේඛනයේ විස්තර කරනු ලබන බලතල එම පනතේ 12 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව මෙම ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව වෙත පවරා දිය යුතුය යන්න යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
අපි ඉස්සරහට යමු

**සභාපතිතුමා :-**
**XIV.1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තිය යටතේ කොන්ත්‍රාත්ගිවිසුම්ගත වීම සඳහා කාරක සභා සඳහා බලය පැවරීම යෝජනාව**
**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 174 IV වන උපවගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව සභාව විසින් අනුමත කරන ලද ව්‍යාපෘතියකට අදාළ දෙවන පාර්ශවයක් සමඟ ඇතිකරගත යුතු කොන්ත්‍රාත් ගිවිසුම් වන විට හා ගිවිසුම්ගත ඇස්තමේන්තු වටිනාකම රුපියල් මිලියන එකක් (1,000,000.00) නොයික්මන පරිදි මූල්‍ය වටිනාකමක් වෙනුවෙන් ගිවිසුම්ගත වීම සඳහා බලය දීම හා ඊට අදාළ ගිවිසුම අනුමත කිරීම සඳහා වන බලතල ඉහත කී පනතේ 12 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව .ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව වෙත පවරාදිය යුතුය යන්න සභාවට යෝජනා කරමි.**

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි මම ඒ යොජනාව ස්ථිර කරනවා

ඒ අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තිය යටතේ කොන්ත්‍රාත්ගිවිසුම්ගත වීම සඳහා කාරක සභා සඳහා බලය පැවරීම යෝජනාව
1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 174 IV වන උපවගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව සභාව විසින් අනුමත කරන ලද ව්‍යාපෘතියකට අදාළ දෙවන පාර්ශවයක් සමඟ ඇතිකරගත යුතු කොන්ත්‍රාත් ගිවිසුම් වන විට හා ගිවිසුම්ගත ඇස්තමේන්තු වටිනාකම රුපියල් මිලියන එකක් (1,000,000.00) නොයික්මන පරිදි මූල්‍ය වටිනාකමක් වෙනුවෙන් ගිවිසුම්ගත වීම සඳහා බලය දීම හා ඊට අදාළ ගිවිසුම අනුමත කිරීම සඳහා වන බලතල ඉහත කී පනතේ 12 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව .ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව වෙත පවරාදිය යුතුය යන්න සභාවට යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
අපි ඉස්සරහට යමු

**සභාපතිතුමා :-**
**XV.1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 100 වන වගන්තිය යටතේ බලය පැවරීම යෝජනාව:**

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 78 වන වගන්තිය යටතේ සඳහන් .ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ මහජන සෞඛ්‍යයට අදාළව ප්‍රරෝහණය හා ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ සඳහන් විධිවිධානයන්ට හෝ වෙනත් කවර හෝ ලිඛිත නීතියක් යටතේ සඳහන් විධිවිධානයන්ට පටහැනිව හෝ නොසලකා හැර කටයුතු කිරීමෙන් කිසියම් පීඩාවක් වන ආකාරයට කටයුතු යෙදී තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා දවසේ සාධාරණ වේලාවක් තුළ කිසියම් වූ පරිශ්‍රයකට ඇතුල්වී පරීක්ෂා කිරීම සඳහා වන කාර්යය මෙහි පහත උපලේඛනයේ සඳහන් සභාවේ නිලධාරීන් වෙත එක්ව හෝ වෙන් වෙන්ව ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 216 වන වගන්තිය සමඟ කියවිය යුතු 100 වන වගන්තයේ විධිවිධාන අනුව සභාපතිවරයාගේ පොදු පරිපාලනයට යටත්ව අධිකාරිය දිය යුතුය යන්න සභාවට යෝජනා කරමි.**

ඉහත කී උපලේඛනය

1. ටී.වී.නිශාන්ත රාමනායක මහතා -කාර්මික නිලධාරී ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව
2. එච්.ගයානි චාමරිකා ද සොයිසා මිය-කාර්මික නිලධාරී ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව
3. පී.කේ.ඩී.අජිත් සිසිර කුමාර මයා -පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක
4. කේ.එල්.කේ.තරංග ජිනසේන මයා -මහජන සෞඛ්‍ය පරීක්ෂක
5. එම්.ඒ.ප්‍රදීප් මාරතුංග මයා-මහජන සෞඛ්‍ය පරීක්ෂක
6. පී.පුසාද් කුමාර මයා -මහජන සෞඛ්‍ය පරීක්ෂක
7. එච්.කේ.එන්.එස්.කුමාර මයා-මහජන සෞඛ්‍ය පරීක්ෂක
8. යූ.ජී.ප්‍රේමකුමාර මයා -මහජන සෞඛ්‍ය පරීක්ෂක
9. පී.එම්.දුමින්ද හර්ෂ සමරනායක මයා-මහජන සෞඛ්‍ය පරීක්ෂක

**සභිකවිජේසූරියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි මම ඒ යොජනාව ස්ථිර කරනවා

ඒ අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 100 වන වගන්තිය යටතේ බලය පැවරීම යෝජනාව:

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 78 වන වගන්තිය යටතේ සඳහන් .ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ මහජන සෞඛ්‍යයට අදාළව ප්‍රරෝහණය හා ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ සඳහන් විධිවිධානයන්ට හෝ වෙනත් කවර හෝ ලිඛිත නීතියක් යටතේ සඳහන් විධිවිධානයන්ට පටහැනිව හෝ නොසලකා හැර කටයුතු කිරීමෙන් කිසියම් පීඩාවක් වන ආකාරයට කටයුතු යෙදී තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා දවසේ සාධාරණ වේලාවක් තුළ කිසියම් වූ පරිශ්‍රයකට ඇතුල්වී පරීක්ෂා කිරීම සඳහා වන කාර්යය මෙහි පහත උපලේඛනයේ සඳහන් සභාවේ නිලධාරීන් වෙත එක්ව හෝ වෙන් වෙන්ව ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 216 වන වගන්තිය සමඟ කියවිය යුතු 100 වන වගන්තයේ විධිවිධාන අනුව සභාපතිවරයාගේ පොදු පරිපාලනයට යටත්ව අධිකාරිය දිය යුතුය යන්න සභාවට යෝජනා වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
බොහොමත්ම ස්තුතියි

**සභාපතිතුමා :-**
දාහසය වියදම් දැරීමේ යෝජනාව

**සභාපතිතුමා:-**
**XVI.වියදම් දැරීමේ යෝජනාව:-**

පහත සඳහන් අතිකාල,ගමන් වියදම්, වෙනත් විවිධ වියදම් යටතේ වූ වියදම් ප්‍රාදේශීය සභාවේ අරමුදලින් , වැය ප්‍රතිපාදන ඉක්මවා නොයන පරිදි ගෙවීට යෝජනා කරමි.

- 2025 මැයිමසඅතිකාල

| අනු අංක | නම | තනතුර | මුදල රු. |
|---|---|---|---|
| 1 | කේ.ඩී.සී.ප්‍රියදර්ශනී මිය | සංවර්ධන නිලධාරී | 8655.00 |
| 2 | ජී.එම්.එස්.ලක්මාල් මයා | සංවර්ධන නිලධාරී | 10979.00 |
| 3 | ඩබ්.එච්.ජී.ඉනෝකා ගුණසිංහ මිය | සංවර්ධන නිලධාරී | 4389.00 |
| 4 | ඒ.එස්.කේ.ධර්මසේන මයා | සංවර්ධන නිලධාරී | 18240.00 |
| 5 | පී.එස්.ඒ.එස්.සෝමරත්න මිය | කළමනාකරන සේවා නිලධාරී | 2408.00 |

| | | | |
|---|---|---|---|
| 6 | එච්.අනුර මයා | සෞඛ්‍ය කම්කරු | 11860.00 |
| 7 | ටී.පී.ගුණතිලක මයා | මාර්ග කම්කරු | 20864.00 |
| 8 | මෙල්සිරි චමින්ද වික්‍රමසිංහ මයා | විදුලි කම්බිකරු | 19167.00 |
| 9 | එච්.සරත් මයා | සෞඛ්‍ය කම්කරු | 3334.00 |
| 10 | ඊ.ජී.එස්.එල්.උපනන්ද මිය | කාර්යාල කාර්ය සේවය | 6053.00 |
| 11 | අසික ඕවින්ද මයා | රියදුරු | 14932.00 |

**සභාපතිතුමා:-**

ඒ 2025 මැයි මස අතිකාල අනිත් ටිකත් කියන්නම් එකට ම ස්ථිර කරමු

**සභාපතිතුමා:-**

අප්‍රේල් මස ගමන් වියදම්

- අප්‍රේල් හා මැයි මස ගමන් වියදම්

| අනු අංක | නම | අදාල මාසය | තනතුර | මුදල රු. |
|---|---|---|---|---|
| 1 | ඒ.වී.එස්.පී.විතාරන මයා | මැයි | ආයුර්වේද වෛද්‍ය නිලධාරි | 5040.00 |
| 2 | ඒ.එස්.කේ.ධර්මසේන මයා | මැයි | සංවර්ධන නිලධාරි | 5914.00 |
| 3 | ජී.එම්.එස්.ලක්මාල් මයා | මැයි | සංවර්ධන නිලධාරි | 5630.00 |
| 4 | ජී.ප්‍රේමකුමාර මයා | අප්‍රේල් | ම.සෞඛ්‍ය පරීක්ෂක | 1680.00 |
| 5 | බී.ඒ.නදුන් ප්‍රියමාල් මයා | මැයි | ආදායම් පරීක්ෂක | 4900.00 |
| 6 | එම්.චන්දිමා ප්‍රියදර්ශනී මිය | මැයි | සෞඛ්‍ය කම්කරු | 2880.00 |
| 7 | එම්.එල්.සී.වීරසේන මයා | මැයි | ඖෂධ සංයෝජක | 3840.00 |
| 8 | ඩී.ඒ.ශිරෝමි පුෂ්පිකා මිය | අප්‍රේල් | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 3007.00 |
| 9 | එල්.රංගිකා ද සිල්වා මිය | මැයි | කළමනාකරණ සේවා නිල | 2880.00 |
| 10 | අසික ඕවින්ද මයා | මැයි | රියදුරු | 4200.00 |

**සභාපතිතුමා:-**

ඒ යෝජනා කළේ ප්‍රාදේශිය සභාවට අදාළ සේවය කරන නිලධාරි මහත්ම මහත්මීන්ගේ අතිකාල දීමනා හා ගමන් වියදම්

**සභිකඑම්.එම්.එම්.මුන්සීර්මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි මම ඒ යොජනාව ස්ථිර කරනවා

**සභාපතිතුමා:-**

වෙනත් වියදම් මං අංක පිළිවෙලට කියන්නම් විස්තරය සමඟ මුදල

**සභාපතිතුමා:-**

- වෙනත් විවිධ වියදම්

| අනු අංකය | විස්තරය | මුදල රු. |
|---|---|---|
| 1. | සෞඛ්‍ය අංශය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලට ගැනීම වෙනුවෙන් බිල්පත් නිරවුල් කිරීම-සී/ස රත්නපුර දිස්ත්‍රික් සමූපකාර ග්‍රාමීය බැංකුව | 14580.00 |
| 2. | සෞඛ්‍ය අංශය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලට වෙනුවෙන් බිල්පත් නිරවුල් කිරීම-සී/ස රත්නපුර දිස්ත්‍රික් සමූපකාර ග්‍රාමීය බැංකුව | 11420.00 |
| 3. | කාර්යාල දෛනික රාජකාරි සඳහා ලිපිද්‍රව්‍ය මිලට ගැනීම වෙනුවෙන් බිල්පත් නිරවුල් කිරීම- සී/ස රත්නපුර දිස්ත්‍රික් සමූපකාර ග්‍රාමීය බැංකුව | 16260.00 |
| 4. | කාර්යාලයේ පරිගණක ප්‍රින්ටර් අවශ්‍ය SAMSUNG 2161 ටෝනර් 02 ක් ෆැක්ස් යන්ත්‍රයට අවශ්‍ය HP PRE 130 ටෝනර් 02 ක් මිලදී ගැනීම වෙනුවෙන් බිල්පත් නිරවුල් කිරීම-නෙක් ඔෆිස් ඔටෝමේෂන්,රත්නපුර | 24000.00 |
| 5. | කාර්යාලයේ දෛනික රාජකාරි සඳහා අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිලට ගැනීම ගැනීම වෙනුවෙන් බිල්පත් නිරවුල් කිරීම- සී/ස රත්නපුර දිස්ත්‍රික් සමූපකාර ග්‍රාමීය බැංකුව | 59430.00 |
| 6. | අනුකූලතා සහතික සකස් කිරීමේ පොත් 02 ක් සකස් කරවා ගැනීම වෙනුවෙන් බිල්පත් නිරවුල් කිරීම-සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය,පරඩයිස්. | 5549.85 |
| 7. | ජල සැපයුම ලබා ගැනීම සඳහා මාර්ග පළුදු කිරීම සඳහා තැන්පත් කරන ලද ඇප තැන්පත් මුදල් නිදහස් කිරීම-වයි.ඒ.ආර්.පී.යාපා මයා.ඇහැලියගොඩ. | 50000.00 |
| 8. | ගැටහැත්ත මහජන පුස්තකාලයේ 2025 අප්‍රේල් මාසයට අදාල පුවත්පත් බිල්පත් ගෙවීම-කේ.පේමචන්ද්‍ර-ගැටහැත්ත. | 6000.00 |

| | | |
|---|---|---|
| 9. | RC 6950 වාහනය සඳහා ඔයිල් සීල් කිට් එකක් මිලදී ගැනීම බිල්පත් නිරවුල් කිරීම -සෙනරත් මෝටර්ස්.ඇහැලියගොඩ. | 800.00 |
| 10. | ගැටහැත්ත මහජන පුස්තකාලයේ 2025 මැයි මාසයට අදාල පුවත්පත් බිල්පත් ගෙවීම- කේ.ප්‍රේමචද්‍ර-ගැටහැත්ත. | 6180.00 |
| 11. | සී/සහිත විවිධ සේවා සමුපකාර සමිතිය,ඇහැලියගොඩ.<br>2025-05-24 දින සිට 2025-05-31 දක්වා ඉන්ධන නිකුත් කිරීම<br>PF-7135 - කැබ් රථය -රු.72670.00<br>PF -6729 - කැබ් රථය -රු.35760.00<br>RD-5104 - ට්‍රැක්ටරය -රු.24660.00<br>RB-4782 - ට්‍රැක්ටරය -රු.12330.00<br>RC-6950- ට්‍රැක්ටරය -රු.18080.00<br>QB- 4780 - ත්‍රිරෝද රථය - රු.2453.50<br>RD-4361 ට්‍රැක්ටරය -රු;18080.00<br>ධූමායනය -රු.16630.00<br>PC-70 එක්ස්කැවේටරය -රු.93160.00 | රු.293.823.5 |
| 12. | පී.සූරියකුමාර මයා - සෞඛ්‍ය කම්කරු(වැටුප් අත්තිකාරම් ගෙවීම | -රු.10000/- |
| 13. | එච්.සමන්ත මයා -සෞඛ්‍ය කම්කරු(වැටුප් අත්තිකාරම් ගෙවීම ) | -රු:7000/- |
| 14. | බී.ඒ.නදුන් විජේරත්න මයා -ආදායම් පරීක්ෂක(වැටුප් අත්තිකාරම් ගෙවීම ) | -රු.10000/- |
| 15. | එච්.සරත් මයා -සෞඛ්‍ය කම්කරු(වැටුප් අත්තිකාරම් ගෙවීම ) | රු.10000/- |

**සභාපතිතුමා:-**

මෙතන පොඩි සටහනක් කරන්න ඕන අපි PC-70 එස්කැවේටරය අපේ සභාවට එස්කැවේටරයක්නෑ .තියෙන එක පාවිච්චි කරන්න බෑ. අපි ඒක කුලී පදනම මත තමයි අර ගෙන තියෙන්නේ ඒ PC-70 එස්කැවේටරය එකට අපි ඉන්ධන ලබා දීල තියෙනවා රුපියල් 93160.00 ක්හැ බැයි මේ මුදල අපිට ආයෙ ඔහුගේ මුදල බැර කරන කොට ආපසු ඒක ලැබෙනවා ඒකත් එක්ක තමයි මේ ඉන්ධන දීමනාව සටහන් කරල තියෙන්නේ
ඒ වගේම මේ ධූමායනය කියන්නේ අපේ MOH එකේ දුම් ගහන මැෂිම

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි මෙම විවිධ වියදම් දැරීම වන සභාවේ යෝජනාවේ හත්වන එකේ සඳහන් මාර්ග පළුදු කිරීම සඳහා වූ ඇප තැන්පත් කිරීම නැවත මාර්ගය සකස් කරලා ඇති නේ ද?

**සභාපතිතුමා:-**

මේක කාර්මිකක නිලධාරීතුමාගේ අනුමැතිය ලැබුණට පසුව තමයි ගෙවන්නේ

ඒ අනුව අතිකාල,ගමන් වියදම්, වෙනත් විවිධ වියදම් යටතේ වූ වියදම් ප්‍රාදේශීය සභාවේ අරමුදලින් , වැය ප්‍රතිපාදන ඉක්මවා නොයන පරිදි ගෙවීම වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**

අපි ඉස්සරහට යමු හත්වන යෝජනාව ආදායම් හා වියදම් පිළිබඳ වාර්තාව

**07.**ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා,වෙනත් වාර්තා

**i.ප්‍රා.ස 14 හා 16 (මැයි මස) මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා :-**

ගරු සභාපතිතුමනි මම ඒයොජනාව ස්ථිර කරනවා

ඒ අනුව ප්‍රා.ස 14 හා 16 (මැයි මස ) මහා සභා අනුමැතියට යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**

එහි දෙවැනි වගන්තිය

**ii.හිඟ ආදායම් වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික ජී.එච්.එස්.එන්.කේ.විජේසූරියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි මම ඒයොජනාව ස්ථිර කරනවා

ඒ අනුව හිඟ ආදායම් වාර්තාව මහා සභා අනුමැතියට යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
අනු අංක තුන

**සභාපතිතුමා:-**
**iii.2024.12.31 දින ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ අවසන් ගිණුම සඳහා ලබා දී ඇති විගණකාධිපති සම්බන්ධ වාර්තාව සභා ගත කිරීම.**

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි මම ඒ යොජනාව ස්ථිර කරනවා

ඒ අනුව 2024.12.31 දින ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ අවසන් ගිණුම සඳහා ලබා දී ඇති විගණකාධිපති සම්බන්ධ වාර්තාව සභා ගත කිරිම ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
අපි එහෙනම් ඉස්සරහට යමු
අටවෙනිඑක වෙනත් යෝජනා

**සභාපතිතුමා:-**

**08.වෙනත් කාරණා**

**I.පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්.**

**සභාපතිතුමා:-**
පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීමේ අවස්ථාවේ ගරු මන්ත්‍රීවරුන්ට මන්ත්‍රීවරියන්ට අදාළව පැහැදිලි කිරීමක් කරන්න තියෙනවා නම් මේ අවස්ථාව ඒ සඳහා විවෘතයි.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි පළමුවෙන්ම මම ස්තුතිවන්ත වෙනවා වියලගොඩ කොට්ඨාශය වෙනුවෙන් මේ සභාව නියෝජනය කරන්න මට ඡන්දය දීලා වියලගොඩ නාකන්දල වසම් දෙකේ ජනතාවට ස්තුති වන්ත වෙනවා මම ඔවුන් වෙනුවෙන් ඔවුන්ගේ ගැටලු සභාවට ගෙනැල්ලා පෙන්නන්න ඒවායේ මැදිහත් කරුවෙක් විදිහට මාව තෝරා ගැනීම සමබන්ධව.ඒ වගේම පසුගිය සභාව නියෝජනය කරපු මන්ත්‍රීවරයෙකු හැටියටත් ඇත්තටම මේ අපි කතා කරපු ප්‍රශ්නවලට අදාළව ගත්තොතින් ගැටලු මේ විශේෂයෙන්ම අපේ ඉදිකිරීමේ නේද ප්‍රාදේශිය සභා විෂයට අදාළව වන මේ ඒවා විධිමත් කිරීම ඒවා නියාමනය කිරීම සංවර්ධනය කිරීම කියන දේවල් ඇත්තටම නිසියාකාරයෙන් වෙලා නෑ මේවගේ අඩුවක් අපට පේනවා අපි ගෙනා 8 වැනි යෝජනාව හැටියට තිබ්ච්ච ප්‍රාදේශය සභාවේ පිටුපස තිබ්ච්ච මිනිස්සු හිතුමතේට ජනතාව වුණත් හිතුමතේට සංවර්ධන කටයුතු කරනවා ප්‍රාදේශිය සභාව විදිහට අපිට ප්‍රාදේශිය සභාවේ තියෙන අධිකාරී බලය නොසලකා හැරලා ජනතාව හිතුමතේට කටයුතු කරනවා ඒවැයින් ඒවගෙන් ඇති වෙච්ච් අතුරු ප්‍රශ්න රාශියක් අපට දැන් විසඳන්න වෙලා තියෙනවා ඒ නිසා මාගේ පැහැදිලි කිරිමවලට වෙලාවක් ගන් නෑ.මේ සභාවට පත්වෙලා ඉන්න මන්ත්‍රීවරු 36 දෙනාටම තියෙනවා විශාල වගකීමක් මෙතෙක් වෙච්ච අඩුපාඩුකම් නිවරදි කරලා අපේ කාලය තුළ අපිට අවුරුදු හතරක් ඇවිල්ලා තියෙනවා අපි ඒ අවුරුදු හතරක කාලය තුළ මේ තිබ්ච්ච අඩුපාඩුකම් නිවරදි කරලා අපේ කාලය තුළ සභාව තුළ මේ සියළුම කාර්යන් නිවරදි කරන්න විධිමත් කරන්න ඒවා තව ශක්තිමත් කරන්න මේ ප්‍රාදේශිය සභාවේ තියෙන අධිකාරී බලය අපි නියමාකාරයෙන් යොදවමින් පසුගිය වෙච්ච අඩුපාඩු පවා නැවත නැවත වැරදි පූර්වාදර්ශයන් නොවන විදිහට අඩුපාඩු නොවන විදිහට අපි මේ සභාව පවත්වා ගත යුතුයි යන අදහස මට තියෙනවා ඒ අදහසත් එකතු කරන ගමන් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා

**සභික ජී.එච්.එස්.එන්.කේ.විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි ගියවර අපේ උපදේශක කමිටුවේදී මම යොජනා කළා,අපි කවුරුත් දන්නවා අපේ කන්තලේ ස්වාමීන් වහන්සේ උන්වහන්සේ මේ ප්‍රදේශයේ ඉතාමත් ම සෑම පොදු කටයුත්තකදිම නායකත්වය දෙන අපේ ගෞරවනීය හිමිනමක්.මම ඒ තනතුර සඳහන් කරේ එදා වාර්තාවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂක ලෙස .එය නිවරදි විය යුතුයි ,අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් සංවර්ධන අධ්‍යක්ෂක ලෙස.

ඊළඟට තව කාරණාවක් තියෙනවා අපේ මහජන පුස්තකාලයේ ඒක හැම පුස්තකාලයටම අදාළවෙයි ,ඒ අපේ ලීඩර්ස්ලා සමහරු සාමාජිකයෝ වෙන්න පුළුවන් ,පුවත්පත් කියවන්නො වෙන්න පුළුවන් ඒ සියලුම දෙනාටම නිසි ගෞරවය දෙන විදිහට ඒ සියලුම දෙනාම අපේ පුස්තකාලයට නැවත සහභාගී වෙලා අපේ ඒ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව වෙනුවෙන් ඒ පුස්තකාලයට උපරිම සේවයක් වෙන විදිහට කටයුතු කරන්න නිලධාරීන් දැනුවත් කරන්න ඉල්ලා සිටිනවා ඔබතුමාගෙන්.

ඊළඟට ගරු සභාපතිතුමනි ඔබතුමා මෙවර පළාත් පාලන මැතිවරණයේදී ජාතික ජනබල වේගය ජයග්‍රහනය කරලා ඔබතුමාගේ කණ්ඩායම සමඟ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමන්ටත් උප සභාපතිතුමන්ටත් ජාතික ජනබලවේගය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ටත් අපේ සුභාශිංශනය පිරිනැමීමට මම මේ අවස්ථාවක් කර ගන්නවා.ඉදිරියේදී ඔබතුමන්ලා ගන්නා වූ සෑම නිවරදි අප බල ප්‍රදේශය වන වසම් 44 ටම සෑම කටයුත්තකදීම ඉතාමත් ම නිවරදි තීන්දුවලට අපේ සහයෝගය දක්වනවා.යම් යම් තැන්වලදී කටයුතු කරන කොට ගැටලු මතුවෙන්න පුළුවන්.අපි ඒ ගැටලු බොහොම අවබෝධයෙන් නිරාකරණය කරගෙන ම් සියලු දෙනාගේම ඔබතුමා ,උපසභාපතිතුමා ඇතුළු අපි සියලු දෙනාගෙම අරමුණ තමයි මේ වසම් හතළිස් හතරෙම ජනතාවගේ සුභ සිද්ධිය සලසන එක.ඒ වෙනුවෙන් තමයි මේ අපි පයිට් කළේ.මං හිතන්නේ හත්දහස් ගණක් තරඟ කරලා තමයි මේ 36 දෙනෙක් පත් වුණේ.අපේ අනෙක් 5 දෙනත් මහා සභාවට සම්බන්ධ වෙයි.අපේ සමගි ජනබලවේග සහෝදරයන් .ඒ නිසා අපි සියලු දෙනා ම Team Workඑකක් විදිහට පක්ෂ භේදයකින් තොරව,පක්ෂ භේදයක් තියෙනවා,අපේ ප්‍රතිපත්ති තියෙනවා නමුත් අපි කාගෙත් ප්‍රතිපත්ති අනුව කටයුතු කරන්නේ.නමුත් සභාවක් විදිහට අපි සියලු දෙනා ම එකතුවෙලා අපි Team Work එකක් විදිහට කණ්ඩායමක් හැටියට වැඩ කරන්න ඕන.ඒ සඳහා ඔබතුමන්ට අපේ ගෞරවනීය සහයොගයදෙන බවට මම ප්‍රකාශ කරනවා.

ඒ වගේ ම මම කියන්න කැමතියි මේ සභාවට බොහොම අභියොග මැද තමයි මම මේ ගමන පළාත් පාලන මැතිවරණයට ඉදිරිපත් වෙලා මහජනනියෝජිතයෙක් බවට පත් වුණේ.මම දන්නවා මේ ඉතිහාසයේ අපේක්ෂකයෙකුට විඳින්න වෙච්ච අපහාස උපහාස ඒ වගේ ම තාඩන පීඩන මැද තමයි මම මේ ගමන ආවේ එදා ඡන්ද 719 ක් අර ගෙන ඒ 719 ලබා දුන්නු ඒ සඳහා කටයුතු කරපු අභියොග මැද ඒ සියලු දෙනාම මුහුණ දුන්නා. ඒ නිසා මම පළමුවෙන් ම මම මේ සභාවේ විශේෂයෙන් ම ඇහැලියගොඩ ආසනයේ ජනතාව වෙනුවෙන් හඬක් නගන්නට, තමුන්නාන්සේලා දන්නවා ඇති එදා 2022 මැයි මාසේ නව වෙනිදා යම් යම් සමහර තැන්වලදී ජනතාව හා තමුන්නාන්සේලා පැවති අවබොධය ගත්තු අපේ කටයුත්තේ දී සම්පූර්ණ දේශපාලන විරොධී බලපෑම් ඇවිල්ලා අපිව යම් වෙනසකට යම් විපර්යාසයකට ඇති කරන අවස්ථාවකට ලක්වුණා.

එදා මං ඒ තීන්දුව ගත්තේ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ පස්වන විධායක ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ ශ්‍රී මතානන් දේශපාලනයෙන් සමුගන්නවා කියන කොට අපි ඒ කටයුත්තට තමයි සහ සම්බන්ධ වුණේ. නමුත් ඒ කටයුත්තේ දී අනිසි පියවරක් විදිහට තමයි ඒ සියල්ලක් ම ඒ බලපෑමට ලක් වුණේ.ඒකත් සිහිපත් කරන්න ඕන. ඒකත් සිහිපත් කරමින් මේ අවස්ථාවට මම නිර්භිතව මේ සමාජයේ ඕනෑ ම කටයුත්තකට සම්බන්ධ වෙන්න මාව නිර්මාණය කරපු, මගේ දෙමාපියන් දෙපල ගෞරවනීය ලෙස සිහිපත් කරනවා.මාගේ පියාණන් ජීවතුන් අතර නොසිටියත් එතුමන් සිහිපත් කරමින් තමයි මම මගේ කතාව පටන් ගන්නේ.

ඒ වගේ ම ඇහැලියගොඩ ප්‍රාථමික විද්‍යාලය ,ඇහැලියගොඩ ධර්මපාල විද්‍යාලය ,ඇහැලියගොඩ ජාතික පාසලට මගේ ගෞරවනී ප්‍රණාමය පුද කරනවා. ඕනෑ ම සභාවක, ඕනෑ ම වේදිකාවක රටේ ජනාධිපතිගෙ ඉඳන් ඕනෑ ම කෙනෙක් සමඟ ඇහැලියගොඩ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් මාගේ ශ්‍රමය හා කාලය කැප කරන්න, මට ඒ ශක්තිය ලබා දුන්නා.ඒ වගේ ම තමයි බුළුගහපිටිය ශ්‍රී සුමන පිරිවෙන් විහාරස්ථානයේ විහාරාධිපති ධම්මපාල ස්වාමීන් වහන්සේ ප්‍රමුඛ සියලු ම විහාරස්ථානවල ස්වාමීන්වහන්සේලාටත්, විශේෂයෙන් ම කන්තලේ විජිත වංශ ස්වමීන්වහන්සේ, වටිනපහ දේවානන්ද ස්වාමීන්වහන්සේ සිහිපත් කරනවා. මට ඒ වගේ ම මීගස්වල ශ්‍රී බෝධිමළු විහාරස්ථානයේ විහාරාධිපති අපේ ලොකු ස්වාමීන් වහන්සේ ප්‍රමුඛ ඇහැලියගොඩ ප්‍රදේශයේ සියලු ම ස්වාමීන් වහන්සේලාට මම මේ අවස්ථාවේදී උන්වහන්සේලාගේ ආශිර්වාදය වෙනුවෙන් ගෞරව ප්‍රණාමය පුද කරන්න අවස්ථාවක් කර ගන්නවා.

වගේ ම තමයි අපි දන්නවා මම විශ්වාස කරනවා ඔබතුමා ඇතුළු මෙතන ඉන්න සියලුම මන්ත්‍රිවරුන්ට මේ අවස්ථාව ලැබුණේ 1987 අංක 15 දරණ පනතෙන් එදා පළාත් පාලන ඇමති සහ අග්‍රාමාත්‍ය රණසිංහ ප්‍රේමදාස තුමා තමයි. මේ පනත සම්පාදනය කරල පනතක් විදිහට පාර්ලිමේන්තුවට දාල අපිව මෙතනට ගේන්න කටයුතු කළේ. එතුමාගේ අපේ ප්‍රතිපත්ති වෙනස් වෙන්න පුළුවන් මේ අවස්ථාවෙ දී මං සිහිපත් කරනවා තුමාට ගෞරවයක් විදිහට.

ඒ වගේ ම තමයි 1991 මේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව නියොජනය කරපු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ එකම මන්ත්‍රී මේ සුනිල් කරුණාරත්න මනත්‍රීතුමා .එතුමත් මම සිහිපත් කරනවා. එතුමා නිසා තමයි මේ දේශපාලන ගමන් මග යම් වෙනසකට පත් වෙලා ප්‍රායෝගිකව සමාජයට වැඩක් කරන්න ඒ නායකත්වය දුන්නේ සුනිල් කරුණාරත්න මැතිතුමා.මම එතුමත් සිහිපත් කරනවා මේ අවස්ථාවේදී.

ඒ වගේ ම පක්ෂභේදයකින් තොරව, සියලු ම භේද වලින් තොරව බුළුගහපිටිය වසමේ, යකුදාගොඩ වසමේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පාක්ෂිකයන්, ඒ වගේ ම එක්සත් ජාතික පක්ෂ පාක්ෂිකයන් ඒ වගේ ම සමගි ජන බල

වේගයේ පාක්ෂිකයන් වගේ ම ජනතා විමුක්ති පෙරමුණේ පාක්ෂිකයන් ,මට ඡන්දය පාවිච්චි කරා, ඒ ප්‍රගතිශීලී ජනතාවට මාගේ හිස නමා ගෞරවය පුද කරන්න අවස්ථාවක් කර ගන්නවා.

ගරු සභාපතිතුමනි ඒ වගේ ම පස්වන විධායක ජනාධිපතිතුමා අපේ අදත් ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා.එතුමා තමයි. අද මං මෙතන මේ සීට් මේ ආසනයේ ඔබතුමාට ආමන්ත්‍රනය කරන්න මට ඒ සැලැස්ම ඒ වැඩපිලිවෙල හැදුවේ මහින්ද රාජපක්ෂ මැතිතුමා මං ඡන්ද 719 ක් ගත්තත් මම රත්නපුර දිස්ත්‍රක්කයේ පොදු ජන පෙරමුණේ අපේ රත්නපුර දිස්ත්‍රක්කයේ අපේ පළාත් පාලන ආයතන 17 ම පස්වෙනියට ඉන්නේ මම. නමුත් යම් යම් බලපෑම් ඇවිල්ල මගේ නම මන්ත්‍රිධුර යම් තැනකට එනකොට මහින්ද රාජපක්ෂ මැතිතුමා මැදිහත් වුණා.

ඒ වගේ ම තමයි ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ ජාතික සංවිධායක ගරු නාමල් රාජපක්ෂ මැතිතුමන් මේ අවස්ථාවේ දී සිහිපත් කරන්න ඕන. ඒතුමාගේ මැදිහත් විමත් ලබා දුන්නා,මේ සභික ධුරය ලබා ගැනීම සඳහා.

ඒ වගේ ම රත්නපුර දිස්ත්‍රික් පොදු ජන පෙරමුණ නායක ප්‍රේමලාල් ජයසේකර මැතිදුන් ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ මහ ලේකම් සාගර කාරියවසම් මැතිතුමා සිහිපත් කරන්න ඕන.

ඒ වගේම සැම අවස්ථාවකදී මට ඡන්දය පාවිච්චි කරලා බුළුගහපිටිය වසමේ යකුදාගොඩ වසමේ මගේ සහෝදර ආරියදාස මන්ත්‍රීතුමාට ජාතික ජන බලවේගයෙන් ඡන්දය පාවිච්චි කරත් ,ඒ සැම කෙනෙක්ගේ ම හදවතේම සැම කෙනෙක්ම මට ඡන්දය පාවිච්චි නොකළත් ඒ හදවත් තුළ සුජීව විජේසූරියගේ නම තිබුණා.

අපි වීථි ලාම්පුව ක් ඉල්ලුවත් කවදාවත් පක්ෂ භේද බලලා නෑ.කිසිම තැනක ඔබතුමා බුළුගහපිටිය වසමේ ඡන්ද වලට ගොඩක් මහන්සි වුණා. ඒක තමයි දේශපාලනය කිසිම ගැටලුවක් නෑ.ආරියදාස මන්ත්‍රීතුමා මගේ දුවගේ ගුරුවරයා. ඒතන කිසිම ප්‍රශ්නයක් නෑ.හැබැයි ඔබතුමන්ලා ඒ පක්ෂයක් විදිහට ගත්තු ඡන්දවලට 719 ක් ලබා දුන්නේ පක්ෂ භේදයකින් තොරව.යම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වුණා. ඒක තමයි දේශපාලනය අපි ඒකට ඔරොත්තු දුන්නා. අපි ඒකට මුහුණ දුන්නා. ඒ නිසා මං විශ්වාස කරනවා මේ බුළුගහපිටිය ,යකුදාගොඩ ජනතාව කිසිම භේදයකි තොරව ,විශේෂයෙන ම සිහිපත් කරන්න ඕන.රාජ්‍ය නිලධාරීන් තැපැල් ඡන්ද පවා මට පාවිච්චි කරා.ආරියදාස මන්ත්‍රීතුමයි පිරිවෙනේ දී කොළේ අත්සන් කරල ගියේ පිරිවෙනේදී. එහෙම තමයි අපට දේශපාලනය සහයෝගය ලබා දුන්නේ. ඒ නිසා මම ඒකත් සිහිපත් කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමා වචනයකින් හරි සමහර වේලාවට අනේ සුජීව නම් ඉන්න ඕන ,ඒත් ඡන්දය දුන්නේ මාලිමාවට, ඒක තමයි ස්වභාවය .ඔබතුමන්ලා අවුරුදු 68 ක් තිස්සේ කරපු කැප කිරීම්වල ප්‍රතිඵලයක් ලෙස ආණ්ඩුවක් ගත්තා. අපි ඒකට ගරු කරනවා. අපි සභාපතිතුමා ,උප සභාපතිතුමා ඔබතුමන්ලා, අපේ උපසභාපතිතුමා දන්නවා අපි මේ සභාවේ වැඩ කරන කොට අපි කවදාවත් පක්ෂ භේදයක් බැලුවේ නෑ.ගැටලු මතු වෙනවා අපි වැඩ කරන කොට .ඉදිරියේදී යම් යම් ගැටලු ඇති වෙයි. අපි ඒ වුණාට සහයෝගය දෙනවා. කිසි ප්‍රශ්නයක් නෑ.

ඒ වගේ ම තමයි වචනකින් හරි ආශිර්වාදය කරපු සියලුම දෙනාටම ගෞරව ප්‍රණාමය පුද කරන්න සුදානම්.විශේෂයෙන් ම යකුදාගොඩ වසමේ ජනතාවට අවස්ථාවක් කර ගන්නවා.

ඒ වගේම අපි ඉදිරි වසර හතර කවුරු කැමති වුණත්, කවුරු අකමැති වුණත් මේ සභාවේ සභාපතිතුමා ඔබ. අපේ මහේෂ් මන්ත්‍රීතුමා උපසභාපතිතුමා. අපි ඔබතුමන්ලා අපි ඒ පැත්තමේ පැත්ත කිව්වට අපි සාමාන්‍යයෙන් ආණ්ඩුපක්ෂය විපක්ෂය තමයි. ඔබතුමා හොඳ නමක් පාවිච්චි කරනවා. ඒකට අපි ගරු කරනවා. ඒක ඒ ඔබතුමන්ලගේ සැලසුම්. ඒක හරි පක්ෂ විපක්ෂ කියන් නෑ වම්පස දකුණුපස .ඒක හරි. ඒකට අපි ගරු කරනවා. ඒ නිසා ඔබතුමා ඇතුළු මේ කණ්ඩායම ගන්න ඕනෑම තීරණයකට අපි ගරු කරනවා සභාපතිතුමනි. මේ අපි මේ සියලු දෙනා සයෝගය දෙනවා ඇහැලිගොඩ ජනතාව වෙනුවෙන් ඔබතුමා ,මම හිතන්නේ මෙතෙක් කල් අපි සභාපතිවරු යටතේ වැඩ කළා. හැබැයි ඔබතුමා මං වැරදි නම් මං නිවරදි කරන්න. ඇහැලියගොඩ සභා බල ප්‍රදේශයේ ඡන්ද නොතිබුණත් ඔබතුමා මේ ඇහැලියගොඩ සම්බන්ධ අපි දන්නවා අපි වසර ගණනාවක් තිස්සේ අපි පුද්ගලික සම්බන්ධතා තියෙනවා. එකට වැඩ කරපු මිනිස්සු. මං විශ්වාස කරනවා කවුරුවත් අමුත්තෙක් ආගන්තුකයෙක් නෙමේ. අපි ඔක්කොම එකතු වෙලා මේ ඇහැලියගොඩ ජනතාවගේ මේ වසම් 44 ජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් අපි එකතු වෙලා කණ්ඩායමක්ව විදිහට වැඩ කරමු. අපෙත් අඩු පාඩුකම් වෙන්න පුළුවන්. අඩු පාඩු වෙන්නැති කෙනෙක් නැනේ. සභාපතිතුමා අපි එකතු වෙලා හෘර්ද සාක්ෂියට එකඟව මේ කටයුත්ත ඔබතුමා කර ගෙන යන්න. ඔබතුමාට අපේ සහයෝගය ලබා දෙනවා. ඔබතුමා මෙනව හරි යම් තින්දුවක් ගත්තොත් අපි අපේ ජනතාවට ජනතාවට යම් විරෝධී ක්‍රියාවකට, සභාපතිතුමනි, ඒකට ඉඩ දෙනනෙ නෑ. මං හිතන්නෑ ඔබතුමා එහෙම ගනී කියලා. ඔබතුමා දේශපාලන වශයෙන් බොහොම පරිණත ප්‍රාදේශිය වශයෙන් මහජන නියෝජිතයෙක් නොවුනට, දේශපාලන ඉතිහාසයේ ප්‍රතිපත්තියක්ව විදිහට ඉන්න පුද්ගලයෙක්. අපි දන්න පුද්ගලයෙක් ඒ නිසා මම හිතනවා උප සභාපතිතුමත් සහයෝගය ලබා දෙයි .අපි සියලු දෙනා එක්ක ම හොඳ දේශපාලන ගමනක් යං .ඔබතුමාගේ නායකත්වය තුළ මේ නගරය අපේ ආරියදාස මන්ත්‍රීතුමා කිව්වාවගේ මේ නගරයේ යම්යම් සැලසුම් අංග සම්පූර්ණ නෑ. අපිත් ඒක පිළිගන්නවා.ඔබතුමා කියන මෙතන මහේෂ් මන්ත්‍රීතුමා සාක්ෂි දරයි.ඔය ground එකේ ඔය ගොඩනැගිල්ල හදන කොට විරුද්ධ

වෙච්ච එක ම පුද්ගලයා මං. දකුණුපස එදා දකුණුපස මන්ත්‍රීවරයෙක් විදිහට මං විතරයි.මහේෂ් මන්ත්‍රීතුමා මතකද?මං කිව්ව ඇහැලියගොඩට ක්‍රීඩා පිට්ටනියක් හදල තමයි ඕක කරන්න ඕන කියලා.

ලේකම්තුමා සාක්ෂි දරයි.වාර්තාවල ඇති බලන්න.වාර්තා චෙක් කරන්න.මම තමයි කියපු එකම මන්ත්‍රීවරයා මේ ground එකේ ground එකක් හදනව මිසක් එක ගොඩනැගිල්ලක් හදන්න එපා කියලා.එදා මාව ගණන් ගත්තේ නෑ. ඒක වෙනම කතාවක් ඒ නිසා ඔබතුමාට බලය දීලා ,ඔබතුමාට ආණ්ඩුවක් තියෙනවා. ජනාධිපතිවරයෙක් ඉන්නවා. මන්ත්‍රීවරු එකසිය පනස් ගාණක් තියෙන පාර්ලිමේන්තුව,ඔබතුමාට මෙතන බලය තියෙනවා. ඒ නිසා අන්න ඒ වැරදි පසු ගිය රජයේ වැරදි ගැන කතා කරන්න ඕන, අන්න ඒ වැරදි නිවරදි වෙනවට තමයි මේ ප්‍රදේශයේ ජනතාව ජාතික ජනබල වේගයට ඡන්දය දුන්නේ. ඒ නිසා ඒ වැරදි නිවරදි කර ගෙන නගර සැලසුමක් හදා ගෙන ඔබතුමා වැඩ කටයුතු කර ගෙන යන්න.අපේ සියලුම දෙනාගේ සහයෝගය ඔබතුමාට ලබාදෙනවා. බොහොම ස්තුතියි අවස්ථාව ලබා දුන්නට.

**සභාපතිතුමා:-**
ඒ වගේම තමයි මම සියලුම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා,මේ අවස්ථාවේ කාලය ගන්න පුළුවන් ඕන දේ කතා කරන්න.වේලාව ගැනත් සැලකිලිමත් වෙන්න.

**සභික මිස්බාහ් මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි මම මෝරගල, පැල්පිටිය කොට්ඨාශයේ ජනතාවට ස්තුති කරන්න පොඩි වේලාවක් ගන්නම්.මොකද මොරගල පැල්පිටිය කොට්ඨාශය අපි ඡන්ද 333 කින් ජයග්‍රහනය කළා.මේ අවස්ථාවේ දී එම නිසා අපි අනිවාර්යෙන් ,දැන් අපේ දිලීන් සහෝදරය මෙතන නැති හින්ද ඒ වගකීම මෙතන්ට අරන් කතා කරන්නේ.මොකද මම මෝරගල කොට්ඨාශයෙන් තරග වැදිච්ච හින්දාතඡ හින්ද මම ඒ ජනතාව වෙනුවෙන් ස්තුති කරන්න.මේ අනිවාර්යෙන්ම ස්තුති කරන කතාව තමයි.මේ සුළු කතාවක් මම නිහඬ වෙනවා.

**සභාපතිතුමා:-**
විවේකය

**සභාපතිතුමා:-**

විවේකයෙන්පසු

**සභාපතිතුමා:-**
කීපදෙනෙක් අපට දන්වලා ලියා ,විශේෂයෙන්ම අපේ මුස්ලිම් මන්ත්‍රීවරු දෙන්නා පල්ලියැම සඳහා.අපි එහෙනම් පටන් ගමුද?

**සභාපතිතුමා:-**
මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීමේ අවස්ථාව.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝමමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි මමබටහිර කලටුවාවෙන් අපේ ඇහැලියගොඩ කෙළවර ම නියෝජනය කරමින් ආවේ.මොකද ඇහැලියගොඩට ටවුන් එකට අපි එන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩකට විතරයි.නැත්නම් අපි ටවුමට යන්නේ අවිස්සාවේල හංවැල්ල ප්‍රදේශ වලට ඉතින් මේ සංවර්ධන වැඩ කටයුතුවලින් ගොඩක් ම ඈත්වෙච්ච සභාවකට ඇතයි.ඉතාකම්කටොලු මධ්‍යයේ ඉන්න ජනතාවක් නියොජනය කරමින් මට ප්‍රාදේශිය සභාවට අවුරුදු 25 ක දේශපාලන අත්දැකීනුත් එක්ක මේ සැරේ මං දේශපාලනය තෝරා ගැනීම ඉතාමත් ම ඒ වැඩ කරපු සහ සහය දුන් හැමොටම ස්තුති කරන්න මේක අවස්ථාවක් කර ගන්නවා.ගොඩාක් කතා කරන් නෑ.කටුක අත්දැකීම් එක්ක ආපු ගමනක් මේක.ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරයෙක් වෙලා මොකක්වත් නෙමෙයි.හැබැයි යම්කිසි බලාපොරොත්තුවක් තිබුණා ජීවිතේ යම් තැනක රටක් විදිහට ගමක් විදිහට ඉතින් දේශපාලන මතය අරන් යද්දී මේ මන්ත්‍රීකමක් වෙනුවෙන් එන්න සිද්ද වුණා.ඉතින් මම සියලු දෙනාට ස්තුතිවන්ත වෙනවා.

ඊළඟ කාරණය තමයි ඇහැලියගොඩ නගරය අපි ලස්සන නගරයක් කරන්න අපි සියලු ම දෙනාට දායක වෙන්න සියලු කැපවීම් කරන්න නොපිරිහෙලා කරන්න මේ සභාවේ පොරොන්දු වෙනවා.ස්තුති වන්ත වෙනවා මේ අවස්ථාව දුන්නට.

**සභික එච්. ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි මන්ත්‍රීවරුනි ඇත්තටම මේ සභාවේ පක්ෂයක සාමාජිකයෙක් වෙලා අවුරුදු 40 ක් වාගේ මේ දේශපාලනයේ නිරත පුද්ගලයෙක් හැටියටත්ඇහැලියගොඩට පිටින් ආපු කෙනෙක් හැටියටත් ඇහැලියගොඩ ජනතාව අතර මම ආරි සර් කියන එකකෙටියෙන් මං පොඩි හැඳින්වීමක් කරන්නම් අපි ඇත්තට ම අපි ස්තුති කරන් නෑ.කාටවත්. මොක ද අපි වැඩ කරල මිනිස්සු තේරුම් අරගෙන ඉවර වෙලා අපිට ස්තුති කරන එක තමයි සිද්ද වෙනනේ.මම නිට්ටඹුවේ සංඝබොධියේ වැඩ කළේ ගම්පහ.මට එන්න සිද්ධ වුණේ ඇහැලියගොඩට මම

ඇහැලියගොඩින් බැන්දේ. මට එන්ඩ සිද්ද වුණේ විශේෂ හේතුවක් වනඒක තමයි ඇහැලියගොඩ ප්‍රාථමික විද්‍යාලය ඒ වෙනකොට ඒ වෙනකොට ඇති වෙලා තිබ්ච්චගැටලුවට මුහුණ දෙන්න.ඒ වන විට මගේ දරුවත් මේ අවස්ථාවේ හිටපු නිසා.අපිත් එක්ක අරගල කරපු සහෝදරවරුත් ඉන්නවා.ඒ අරගලය මාස අටක්ඇහැලියගොඩ ප්‍රාථමික විද්‍යාලය වෙනුවෙන් කරගෙන ගියා.ඒකෙ දී විශේෂයෙන් ම ප්‍රාථමික විද්‍යාලය ,මේක අරගෙන ගියා විජේනායකයට.ඒ අරගෙන ගිය වෙලාවේ ළමයි 320 ක් වෙනුවෙන් මාස අටක් අපි අරගලයක් කළා.ඒ දැවැන්ත අරගලයෙන් පස්සේ මම හිතනවා ජජ්ලා තිදෙනෙක් මාරු කළා රත්නපුර උසාවියේ මේ ප්‍රශ්නය හින්ද එවකට හිටියේ මහීපාල හේරත් කියන මහ ඇමතිතුමා ඔහු ශත පහකට ගණන් ගන් නැති දරුණු ගණයේ පුද්ගලයෙක් හැටියට තමයි අපි හදුනා ගෙන තිබුණේ.ඒ අවස්ථාවේදි ඒ මාස අට ඇතුළෙ දී අපි සාමකාමීව අපි කල යුතු සෑම දෙයක් ම කරලා අපි උසාවියේ දී නඩුව අපි දිනුව. එන්න ඒ නඩුවත් එක්ක ආරි සර් කියන පුද්ගලයා මෙහේ දන්න අදුරන පුද්ගලකේ බවට පත් වුණා.එදා ඉදලා අර රාජකාරී මට්මේ විශාල ගැටලුවකට මං මුහුණ දුන්නා.ඒකෙදි ජීවිත අවදානමකුත් අබට තිබුණා උසාවියේ දී අපට පුළුවන් වුණා නැවත ප්‍රාථමික විද්‍යාලය මෙතන ස්ථාපිත කරන්න.ඒ වෙනුවෙන් අපි දායක වුණ ඒ සතුට අපි ළඟ තියෙනවා.අදත් ඒක මිනිස්සු අපි වෙනුවෙන් බලන්නේ අපිට සලකන්නේ අපි දෙයක් කළ හින්දා.

ඒවගේම තමයි ඇහැලියලගාඩ ඩෙංගු මරණ හය දෙනෙක් වුණා .600 ක් ඩෙංගු රෝගීන් ඒ අවුරුද්දෙ නැති වුණා.ඒ අවස්ථාවේ දී හිටපු වෛද්‍ය ඩොක්ටර් අබේවික්‍රම මහතයත් එක්ක අපි එකතු වෙලා ඇහැලියගොඩට සියලුම වසම්වල ඒ ඩෙංගු මර්දන ව්‍යාපෘතියේ ශාඛා පිහිටුවලා ඔහු හදුනා ගත්ත ඩෙංගු කීටයින් විනාශ කිරීමේ ව්‍යාපෘතිය අරගෙන ගියේ ඒ අවුරුද්දේ පසු අවුරුද්ද වෙනකොට එක ඩෙංගු රෝගියෙක් නැති වෙන විදිහට ඒ දැවැනත වැඩසටහන ක්‍රියාත්මක කළා ඒක ලංකාව පුරා ම විසිරිලා ගියා.මේක බලන්න පිට පළාත්වල මන්ත්‍රීවරු ඇමතිවරුපවා ආවා.ඇවිල්ල ඉවර වෙලා ඒ වෙනුවෙන් ස්තුති කරලා ගියා .හැබැයි අපේ හිටපු දේශපාලඥයෝ මේකෙ දී හැබැයි ඔක්කොමල නෙමෙයි ඒක නිසා ඒකට අකුළ් හෙලලා ඒක කඩාකප්පල් කරා.හැබැයි දැන් මේ වෙනකො තවමත් අප්‍රිකාවේ ඒ වගේම මැලේසියාවේ වැඩසටහන ක්‍රියාත්මක වෙනවා ඒක ඉන්ටනෙට් එක හරහා ඒ කාලෙ තිබුණා ඒ වැඩසටහන ඒක්කම ජනතාව වෙනුවෙන් විශේෂයෙන් ම ළමයි පාසලට ඇතුළත් කර ගැනීමේ ප්‍රශ්නවලදී මම පෞද්ගලිකව පුද්ගලයෙක් හැටියට මානව හිමිකම් අවුරුදු හතරක මගේ නමින් මානව හිමිකම් ගිහින් තියෙනවා.මගේ ළමයි වෙනුවෙන් නෙවෙයි.මේ ඇහැලියගොඩ දෙමාපියන්ගේ දරුවෝ වෙනුවෙන්.අපි ඒවා ජයග්‍රහනය කරල හිටන් ඒ මිනිසුන්ට ඒ දරුවන්ට අයිතාවාසිකම් අරන් දීලා තියෙනවා ගිය අවුරුද්දේ.දැන් මේ අවුරුද්දේ ප්‍රාථමික දාගන්ඩ ළමයි 16 දෙනෙක් ඔවුන්ට ඔප්පු නැති නිසා පළවෙනි Intervive එකෙන් ම වැටිල තියෙනවා.ඒකට අපි මැදිහත්වෙලා මේ අවුරුද්දේ ළමයි 12 දෙනෙක් ප්‍රාථමිකේට දාල දුන්න හැබැයි.අපි සද්ද කරේ නෑ.අපි ඒක කරල දුන්නා.ජාතික පාසලටත් ළමයි ඇතුළත් කර ගැනීමේදී ඒ වෙනුවෙන් නඩු කියලා ඒ එක්කම මානව හිමිකම් ගිහින් ඒ වදිහට ළමයි ඇතුළත් කර ගන්න අපි මහන්සිවෙලා කරල දීල තියෙනවා.හැබැයි කිසිම වෙලාවක ඒවා වෙනුවෙන් කතා කරන්නවත් කණ්ඩායම් එක්ක කියන්නවත් එහෙම ගිහින් නෑ.හැබැයි ඒවා මිනිස්සු අතරට ගිහින් මිනිස්සු කතා කරනවා මෙහෙමයි දැන් මට අය ඡන්දෙ නොදෙන්න තීන්දු කරල තිබුණා හේතුව තමයි ඇහැලියගොඩ ධර්මපාලෙ ආරි සර් ගියාට පස්සෙ ඇහැලියගොඩ ධර්මපාලෙ වැටෙනවා.ඒ නිසා මෙයාට ඡන්දෙ දීලා පත් කරලා එහෙ යවල හරියන් නෑ.මේකෙ තියාගන්න ඔනෙ කියලා.ඒ ගොල්ලෝ දන්නෙ නෑ මේ procedureඑකමොක්ද කියලාදැනුත් මම ඊට පස්සේ ඇහැලියගොඩ ධර්මපාලෙට .මම ඉල්ලා ආපු එකක් නෙමෙයි.මේ අපේ කණ්ඩායමඋත්සහ කලේ ඒ කණ්ඩායමේ කට්ටිය තින්දු කරල මාව ගම්පහින් මෙහෙටගෙනැදින් ඉවර වෙලා මෙහේ ළඟම තියෙන පාසල ධර්මපාලෙට මාව ඇතුළත් කරන්න සියල්ලක්ම කළේ ඒ ගුරු සහෝදරවරු.නැතුව මග මහන්සි වුනේවත් මොකවටවත් නෑ ඊට පස්සේ මට පලවෙනියෙන් ම කිවුවේ ධර්මපාලෙ ෙ කොහොම හරි හදන්න ඕනෙ කියලා.එතකොට ඒ වෙනුවෙන් ගොඩ එහාට අරන් යන්න උත්සහ කරන් නෑ.මොකද මිනිස්සු අපිත් එක්ක ගණුදෙනු කරන්නේ ඉතින් ඒක අද වෙනකොට මම තනියම කරපු දේවල් නෙමේ මේ කිසිම දෙයක් කණ්ඩායම් එක්ක එකතු වෙලා මේ කරපු ක්‍රියාවලිය හරහා අද ජාතික පාසලට වැඩිය ඉල්ලුමක් ඇහැලියගොඩ ධර්මපාල විද්‍යාලයට තියෙනවා.මේවන විට ලිස්ට් එක තියෙනවා ළමයි ඇතුළත් කරන්න ශිෂයත්වයෙන් පාස් ළමයි පවා ඉතින් එහෙම අපි යමක් ඒකට කරලතියෙනවා.ඒ හැමදෙයක් ම කරන්න මූලික වෙන්නේ අපේ පක්ෂයේ ප්‍රතිපත්ති.ඒ ප්‍රතිපත්තිවල ඉදගෙන ඔය 88 / 89 වයසක මිනිහෙක් මෙහෙමහිටියට 88 /89 භීෂණයට අහුවෙච්ච කැළෑවල් වල හිටපු අපිත් එක්ක එකට වැඩ කරපු මිනිස්සු මැරි මැරි වැටෙද්දී අපි බලාගෙන ඇස් පනාපිටම අපි දැකපු අපේ තිබුණා හීනයක්ඒ හිනය සැබෑ වෙන්නේ කවද්ද කියලා හිතන් අපි ඇඟිලි ගැන ගැන හිටියා.හැබැයි ඇඟිලි මදි වුණා ගණන් කරන්න.ඒ වුණාට අපේ පල පැදියන් වෙච්චි ඉලක්කයක් තිබ්බා.ඒක තමයි අපේ ප්‍රතිපත්තියඒ ප්‍රතිපත්තිය කවද හරි ජය ගන්නවා.කියන එක අපි ඉගෙන ගෙන තිබුණා.ඒ ඉගෙන ගත්ත ප්‍රතිපත්තිය ජය ගන්න අවස්ථාව අපට පෙනි පෙනී තිබුණා එන්න ඒක තමයි මේ රට වෙනස් කරන්න අවුරුදු 1965 ඉදල මේ වෙනකන් ගෙනාපු ඒ වැඩ සටහනේ අවසාන ප්‍රතිඵලය උදා වෙලා මේක මල්ඵල ගැන්වෙමින් තියෙනවා. ඉතින් අන්න ඒ අවස්ථාවට මම අපේ රජයක් බිහි වෙන කොට මටත් ඒකෙ දායකත්වයක් දරා ගන්න ඕන මැරෙන්න කලින් හරි මොකද අපි හැමවෙලේ මහැමවෙලේ මමිනිස්සු තමයි වැඩ කරන්නේකතා කරන්නේඕනම අරගලයක් තියෙන වෙලාවක අපි එතන ඉන්නවාකෙලින් ම මම ලංකා ගුරු සේවා සංගමයේ අපේ වෘත්තීය සමිතියේ ඇහැලියගොඩ සංවිධායක හැටියට වැඩ කළා ඒ හැම ගුරුවරයෙක් වෙනුවෙන ම අපි පෙනී සිටියා හරි අපට දේශපාලන අපේ වෘත්තීය සමිති අපට එහෙම අදාළත්වයක් නෑ.ඒ වෙනුවෙන් අපි පෙනී සිටියා දේශපානය වශයෙන් සුජීවයි මායි දෙන්න දෙපැත්තක සිටියේ හැබැයි සුජීව මොකක් හරි කිවුවහ ම මම ඒකට උදව් කළාඅපේ දේශපාලනයක් නැති නිසාහරි අපි නිර්ධන පංතියේ අහිංසක

දුප්පත් මිනිසුන්ගේ දරුවෝමෙතන කිසිම සහෝදරයෙක් නැමෙතන කිසිම කෙනෙක්  නෑ මෙතන ඉන්න සියලුම අය මේ නිර්දන පංතියේ දුප්පත් මිනිසුනගේ දරුවෝඑහෙම නම් අපේ වගකීම මොකක්ද අපේ වගකීම විය යුත්තේ මේ අපේ පංතියේ මිනිසුන් වෙනුවෙන් වැඩ කරන  ඒකට අපට කාලයද සල්ලිද වාහනද වෙන මොකවත් ඕන් නැමට මොකවත් නෑ අඩුම තරමින් පුටසයිකලයක්වත් නෑ. ඒවුණාට මම කලටුවාවට යන්න කිවුවොත් මම යනවාකලටුවාවට පයින් හරි යනවා මගෙ රාජකාරිය ඒක අපි විශ්ව විද්‍යාලයේ  ඉන්න කාලෙ පවා විශ්ව විද්‍යාල ශිෂ්‍ය සම්ගම්වලඅපි සභාපතිවරු වෙලා වැඩ කරල තියෙනවාඅන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ වැඩ කරල තියෙනවා හරි මේ  හැම එකකින් ම අපි ඉගෙන ගත්ත දේ තමයි අපි පංතිය පන්තිය වෙනුවෙන් පෙනී සිටින්න ඕන.ඒ නිසා අපි කොයිම වෙලාවකවත් තව මිනිහෙක් කපන්න තව මිනිහෙක් තලන්න තව මිනිසෙකුට දෝශාරෝපනය කරන්ඩ එහෙම අපේ ප්‍රතිපත්තියේ නෑ.  අපට ඕනේ මේ හැම මින්හෙක් ම සතුටින් ඉන්නවා දකින්න.මේ හැම මිනිහෙක්ට හොඳ ජීවිතයක් ඇති කරන්න ඒ වෙනුවෙන් මෙච්චර දෙයක් කරන්න පුළුවන් නම් ඒක සතුටට කාරණයක්.අපි සතුට ලබන්නේ ඒ කැපවීම් කරල මිසක්ලා සල්ලි ගොඩ කරලා වාහන ගොඩ කරලා එහෙම නැත්තන් තව තව දේවල් කරල නෙමෙයි .ඒක අපේ ප්‍රතිපත්තිය නෙමේ.අනුර සහෝදරයා ජනාධිපති වෙලා ජනාධිපති මන්දිරය පැත්තකින් තියලා ඇවිදින් ඉවරලා දැන්සරල විදිහට ඉනනේ ඒ එයාගේ ප්‍රතිපත්තිය තුළ එයානැතිව ජනාධිපති හින්ද නෙමේ.ඒ ප්‍රතිපත්තිය හින්ද ඒ .ප්රතිපත්තියේතමයි අපි ඉන්නේ ඒක නිසා සහෝදරවරුනි මන්ත්‍රීවරුනි  අපි කලයුත්තේ මේ හැම මිනිසෙක් වෙනුවෙන් ම මොනව හරි දෙයක් කරන්න හරි ඒක නිසා මට තව ගොඩ දේවල් කතා කරන්න තිබුණත් මම හිතනවා මෙතන ඉන්න සියලුම දෙනා එකම පන්තියක එකම මිනිසුන් කොටසක්.අපට දේශපාලන මොනව තිබ්බත් කමක් නෑ අපි ඒ මේ අහිංසක මිනිසුන් වෙනුවෙන් වැඩ කරමුමෙතන මම ගොඩාරියක් දේවල් කියන්න බලාපොරොත්තු වුණා. ඒක කියන්න විදිහක් නෑ ප්‍රශ්න ගොඩක් තියෙනවා ඇහැලියගොඩ.ඇහැලියගොඩ ප්‍රශ්න කෙළවරක් නෑ.ජල ප්‍රශ්නය,ඊට පස්සේ කාණු පද්ධතිය පාරවල් ,කුඹුරු අස්වද්දන එක.ඊට පස්සේ නගරය සම්පූර්ණයෙන් හදන්න ඕන.අනවසර ඉදි කිරීම් තියෙනවා.ඊට පස්සේ මේවා බලහත්කාරයෙන් අල්ල ගත්ත ඒවාතියෙනවා.ඊටපස්සෙ  පොල,පොලක් ඇත්තේ ම නෑ.පොලේ ඉන්න මුදලාලි ටික ඔහේ ඉද ගෙන ඉන්නවා.හැරෙන්න පොලක් නෑ.වටට් මෙතන ඉදන් පටන් ගත්තාහම මේ හැම තැනම එලවළු.මාළු මුදලාලි අතන හන්දියේ මාළු ලොරියක් දාගෙන ඉන්නවා ඉතින් මේවා අක්‍රමවත්පිරිසිදු කමක් නෑ අපිරිසිදුයි.මිනිහෙකුට පාරේ යන්න විදිහක් නෑ.ඉතින් මේ හැම එකක් එක්කම අපි කතා කරන්න ඕන.ක්‍රීඩාංගනයක් අපට ඇත්තේ ම නෑ.සභාපතිතුමනි ක්‍රිඩාංගනයක් අපට නෑ.ක්‍රීඩාංගනය තියෙනවා භාගෙට හදලා තියෙන්නේ.ඉතින් මේවා ඉස්සරහට මොනව හරි ඉස්සරහට කළ යුතුයි.අපි අපේ සභාව හැටියට අපිට කරන්න විශාල වැඩ කොටසක් තියෙනවා ඒ මේ හරහා මම හිතනවා ඇහැලියගොඩ යකුදාගොඩ වසමේ බුළුගහපිටිය යාය පාර දන්දෙනිය මේ මිනිස්සු අපට ඡන්දය දුන්නේ අපේ ප්‍රතිපත්ති ගැන හිතල මිසක්කා  මං ගැන හිතල නෙමේමට ඡන්දය.ඒ කෙදි යම් කිසි වරප්‍රසාදයක් තිබුණා මං ඇහැලියගොඩට යමක් කරා  නේ දමේ පුද්ගලයා මෙහෙම කරල තියෙනවා නේ ද කියලා කියන එකත් ඒකට එකතු වුණා මිසක්කා  මේ වෙලාවේ මාව පත් කරගත්තොත්  සුදුසුයි කියලා මොකද අපේ ඇහැලියගොඩ තරුණයෝ ඉන්නවා එකයි දෙකයි තුනයි හතර දෙනෙක් මෙතන පත්වෙලා ඇවිදින් ඉන්නවා එහෙම අය ඒ ගමේ ඉපදිච්ච මිනිස්සු හරි සුජීව සහෝදරයා මේකෙ හිටියා තුන්වෙනි පාරටත් නේද  තුන් වෙනි පාරක් කියන්නේ අවුරුදු 12 ක්එහෙම ඉන්නැද්දිත් මට ඡන්ද1297 ක් ලබලා දෙද්දි සුජීව සහෝදරයාට ඡන්ද හත්සිය ගානක් හම්බෙන්නේ ඇයි එහෙම වෙන්න හේතුව අපි දකින දැක්ම හා අපි දකින ක්‍රියාවලිය තුළ අපට මිනිස්සු යම්කිසි දෙයක් අපට දීල තියෙනවා හැබැයි අපට යම්කිසි දෙයක් දීල තියෙන්නේ උබලා මේ තියෙන වැඩ ටික කරපල්ලා හරි. බලාරොත්තු වෙනවා මේ වැඩ ටික උබලගෙන් එහෙම නැත්තන් එන්න එපා අපට කතා කරන්න කියලා ඒක නිසා සභාපතිතුමනි අපි යම්කිසි විදිහක බැදීමක් තියෙනවා අපේ ප්‍රතිපත්තියෙත්.ඒ කොටස තියෙනවා ඒවා ඒවා යුහුසුළුව කරන්න අවශ්‍යයි.ඒ වෙනුවෙන් අපි සැදී පැහැදී ඉන්නවාඅපට ගමට ගිහින් හිටන් ඒ වැඩ කරන්නඅපට අවස්ථාව තියෙනවා මේ නිසා මේ සියලුම කොට්ඨාශවල සහොදරවරු වැඩ කරලා ඇවිදින් ඉන්නේ ඒ හින්ද ඒක හින්ද අලුත් දෙයක් මෙතන නෑ වැඩ කරන්නයි අවශ්‍ය වැඩ කරන්න ප්‍රතිපාදන කොහෙන් හරි අපට ප්‍රාදේශිය සභාවෙන් දෙන්න පුළුවන් සීමිත ප්‍රමාණයක් දෙන්න පුළුවන් පළාත් සභාව මහා ආණ්ඩුවේ නොයෙන් විදිහේ අමාත්‍යාංශ හරහා ගන්න පුළුවන් සියලුම දේ ගන්න පයිට්  කරල හරි ඒ නිසා එහෙම කරන්න  කියලා මම සියලුම දෙනාට මේ අවස්ථාවේදී ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය:-**

සභාපතිතුමනි ප්‍රථමයෙන්ම මම සුභාශිංෂන පතනවා සභාවේ සභාපතිධුරයට පත්වීම සම්බන්ධව ඒ වගේම මං මේවෙලාවේ මතක් කරන්න ඕනේ මගේ පියා අවුරුදු 25 කට වැඩි මේ දේශපාලන ප්‍රාදේශිය සභා මන්ත්‍රිවරයෙක් වශයෙන් ඉදලා මං හිතන්නේ පක්ෂයට වැඩිය විපක්ෂයත් එක්ක එකතු වෙලා ලොකු කාර්ය භාර්යක් ජනතාවට නගරයට ප්‍රදේශයට සිද්ධ කරපු මන්ත්‍රීවරයෙක් විදිහට ඒතුමා සාධාරන දේට තමයි එතුමා හැමදාම පෙනී සිටියේ අසාධාරණයට විරුද්ධව මං හිතන්නේ වැඩියෙන්ම මිනිස්සු දන්නේ මගේ පියා මේ වෙලාවේ එතුමාව වැද නමස්කාරව මතක් කරනවා ඒ වගේම මං මෙතනට එන්න කිසිසේත් ම මගේ දේශපාලන ජීවිතය ගැන හිතුවේ නෑ.හේතුව පියාගෙන් පස්සේ දරුවෝ එන්ඩ ඕන කියන මතයට මම නෑ.ගෙදර කවුරුත් ම දේශපාලනයට එන්න නොසිටියත් සිදු වූ අසාධාරණ ස්ථාන මාරුව හේතුවෙන් අසාධාරණයට ලක් වූ නිලධාරීන් වෙනුවෙන් යම් හඬක් නගන්න ඕන කියලා තමයි මන්ත්‍රිවරියක් විදිහට මේ ඡන්දයට ආවේ.ඒකත් එක්ක ම ඒ වෙලාවේ මට මෙම අවකාශය ලබා දුන්නේ මෙම අවස්ථාව ලබා දුන්න පවිත්‍රා දේවී වන්නිආරච්චි මැතිණියට

